Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2025), Vol. 10 (01)

# Etymological Analysis of Anatomical Terms in the Female Reproductive System in Ayurveda Treatises

D. Pushpa Kulanatha

Department of Basic Principles Anatomy and Physiology, Faculty of Indigenous Medicine, University of Colombo, Rajagiriya, Sri Lanka

**Article Info**

Article History:
Received 12 June 2024
Accepted 03 June 2025
Issue Published Online
01 January 2025

**Key Words:**
Reproductive System
etymological analysis
Nirukti
Bhaga
Garbha

*Corresponding author
E-mail address:
ipitakaduwa@fim.cmb.ac.lk

https://orcid.org/0009-0007-9451-1205

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v10i01.11

VJHSS (2025), Vol. 10 (01), pp. 177-194

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2025

## ABSTRACT

*Ancient Ayurveda treatises, dating back over 200 BC, meticulously encoded vast medical knowledge within their Sanskrit verses. Examination of these treatises reveals a specialized terminology for describing the female reproductive system, necessitating careful interpretation through etymological analysis. This study employed an epistemological approach to analyse the etymological explanations of 27 key terms related to female reproductive anatomy and physiology, as presented by historical commentators and contemporary scholars. This analysis aimed to validate and clarify the terminology employed in classical Ayurveda treatises. Comprehensive etymological analysis yielded a deeper understanding of the terminology, revealing aesthetic nuances, literary context, philosophical implications, morphological reflections, physiological knowledge, and semantic interpretations embedded within each term. The study delved into the rich metaphorical language used in Ayurveda texts, uncovering connections between anatomical structures and natural phenomena, underscoring the holistic view of the female body within Ayurveda philosophy. Further, by tracing the evolution of these terms through different eras of Ayurveda literature, the research shed light on the dynamic nature of medical language and knowledge transmission within the tradition. Integration of etymological analysis with poetic and verse references from Ayurveda treatises illuminated a holistic understanding of the female reproductive system. This multifaceted approach not only fostered self-realisation and an appreciation for nature's intrinsic beauty but also equipped future Ayurveda physicians with a comprehensive understanding of reproductive health, including the pathology of each component. By bridging the gap between ancient wisdom and modern medical understanding, this study contributes to the ongoing revitalisation of Ayurveda as a relevant and effective system of healthcare*

**මාතෘකාව**

ආයුර්වේද සංහිතා ග්‍රන්ථගත ස්ත්‍රී ප්‍රජනක ව්‍යුවහාවේ පද නිරුක්ති සහ පද නිරුක්තකරණය.

## 1. හැඳින්වීම

ආයුර්වේද ශාස්ත්‍රීය අධ්‍යයනය සුවිශේෂ වන්නේ එය ශාරීරික සහ මානසික සුවය අත්විඳීමෙහි මෙන්ම වෛද්‍ය කර්මය පිළිබඳවත් දැනුම ලබාදෙන ශාස්ත්‍රයක් මෙන් ම කාව්‍ය සහ භාෂා සාහිත්‍ය ශාස්ත්‍රීය මූලයක් වශයෙන්ද පෝෂිතව ඇති බැවිනි. ආයුර්වේදය ආරම්භයේ සිටම උසස් සම්ප්‍රදායක් වශයෙන් විවිධ මානයන් ගෙන් මෙම සාහිත්‍ය අර්ථකථනය සිදුකිරීම විවිධ කතෘවරුන් මගින් සිදුවිය.

වෛයාකරණ, ඡන්දශාස්ත්‍ර නිරුක්ත සහ ඓතිහාසික වැනි ශාස්ත්‍රීය සම්ප්‍රදායන් ඔස්සේ ආයුර්වේදයේ ගද්‍ය සහ පද්‍ය සාහිත්‍ය අර්ථ ගැන්වීම සිදුවී ඇත. ඒ අතුරින් නිරුක්ත හෙවත් අර්ථ විග්‍රහ ශාස්ත්‍රය (The Science of Etymology) වඩාත් සුවිශේෂ වන්නේ ආයුර්වේදයේ ඇති සූත්‍ර සහ ශබ්ද සම්බන්ධයෙන් ස්වභාවිකත්වයට වඩා ළංවූ අර්ථ ගැන්වීමකින් වේදාංගයක් වශයෙන් ආයුර්වේදය වඩාත් උසස් මට්ටමක රඳවන බැවිනි (Panja n.d.).

තියුණු මනෝ ආධ්‍යාත්මික ප්‍රභව වූ, ඍෂි-භාෂිතයෙන් ව්‍යාඛ්‍යානය වූ ආයුර්වේදයෙහි (Kumarasingha, 2006) වඩාත් සරුව ඇත්තේ බොහෝ සෙයින් බහු ආංශිකවූත්, කේත ස්වභාවිතවූත් (coded language) භාෂාවෙන් එකී මූල සංහිතා ශාස්ත්‍රය හෙවත් මූලසංහිතාව සැකසී තිබීමයි. සංහිතා ග්‍රන්ථයෙහි පවත්නාවූ අර්ථ ගැන්වීමේ අසීරු වචන නිඝණ්ටු (glossaries and thesauri) ගත කිරීම මේ අනුව වේදකාලයෙන් පසු වෙනස්ව ඇතිවූ ග්‍රන්ථ රචනාවකි. නිරුක්ත යනු එකී නිඝන්ඩු විශලේෂණය කිරීමට භාවිත වන ක්‍රම වේදයයි. මේ අනුව නිරුක්ත මගින් ආයුර්වේද සංහිතාගත සූත්‍ර (verses) එමෙන්ම අත්දැකීම් සහ විශ්වාසයන් ගෙන් ස්ථාපිත වූ සංකල්ප (concepts based on experience and believes) සහ සායනික අධ්‍යාපන අංශ (clinical knowledge) යනාදියෙන් ගහණ වූ කරුණු ශාස්ත්‍රීය වශයෙන් විග්‍රහ කර දැක්වේ. අර්ථ දැක්වීමට අනුව නිඝණ්ටු යනු නිගූඪ අර්ථය නැතහොත් ගැඹුරු මූල පරිහරණයෙන් අර්ථ ගැන්විය යුතු කරුණු අන්තර්ගතයකි. නිරුක්ත මගින් සිදු වන්නේ මෙම අර්ථ විග්‍රහ සොයා දීමයි.

ඒ අනුව සැඟවුණු අර්ථය සොයා ගනිමින් සංක්ෂිප්ත කරන වචනය නිරුක්ති (definition / Etymon) නම් වේ. නිරුක්ත මගින් නිරුක්ති සොයා ගැනීම (etimology - නිරුක්ත ශාස්ත්‍රය) නිරුක්ත වේදය වේ. ආයුර්වේදය මෙය ශුද්ධ විද්‍යාවක් (pure science) හා තාක්ෂණික විෂයයක් (technology) වශයෙන් එහි අන්තර්ගත ව්‍යාකරණයන්හි ප්‍රායෝගික අංශය විග්‍රහ කිරීම නිරුක්ත මගින් සිදු වේ (Panja, n.d.)

වචන හෙවත් පද තුන් ආකාරයක් ගනී. ප්‍රත්‍යක්ෂ ක්‍රියා, පරෝක්ෂ ක්‍රියා සහ අතිපරෝක්ෂ ක්‍රියා වශයෙනි. ප්‍රත්‍යක්ෂ ක්‍රියා පද ව්‍යාකරණ මගින් හසුරුවන අතර පරෝක්ෂ ක්‍රියා පද ව්‍යාකරණ සහ නිරුක්ත මගින් අර්ථ සපයයි. අතිපරෝක්ෂ ක්‍රියා පද ඒ අනුව නිරුක්ත මගින් පමණක් විග්‍රහ වේ. ආයුර්වේද සංහිතාවන් මෙම පරොක්ෂ ක්‍රියා පද හා අතිපරෝක්ෂ ක්‍රියා පදවලින් විෂය කරුණු අන්තර්ගත කර ඇත. මේ හේතුවෙන් නිවැරදි නිරුක්ති සපයා ගනිමින් අර්ථ විග්‍රහ සැපයීම ආයුර්වේද අධ්‍යයනයේ ශාස්ත්‍රීය සහ තාක්ෂණික භාවිතය වශයෙන් සැලකේ.

ව්‍යාකරණ සහ නිරුක්ත යනු එකිනෙක පද මත නිරූපණය වන්නකි. පදයක විග්‍රහය (සැකසීම) ව්‍යාකරණය වන අතර නිරුක්ත යනු වචනයක (පදයක) අර්ථය පද එකක් හෝ කිහිපයක් මගින් විග්‍රහ කිරීම යි (Yaska, ca. 7th–5th c. BCE, as translated by Sarup, 2015). එබැවින් නිරුක්ත යනු විශ්වීය ඥානයක තාක්ෂණික භාවිතයට අයත් ව්‍යාකරණවල ප්‍රයෝගික යෙදීම යි. එනිසාම ආයුර්වේදය යනු ප්‍රායෝගික විද්‍යාවක් වශයෙන් නිරුක්ත සහ නිරුක්ති පිළිබඳ පැහැදිලි අවධානයක් සහ අවබෝධයක් අවශ්‍ය වන විෂයකි. එමෙන් ම ඕනෑම ශාස්ත්‍රයක පදනම යෙදෙන්නේ එහි යෙදෙන්නා වූ තාක්ෂණික වචන මගිනි. විශේෂයෙන් ආයුර්වේද සංහිතාවන්හි එය දැකිය හැකි වන්නේ සංහිතාවන්හි ඇති විෂය කරුණු කේතාන්විත පෙළගැස්මකින් යුක්ත බැවිනි. තවද පදවල අන්තර්ගත විද්‍යාත්මක සහ තාක්ෂණික අර්ථ කේතික පදවල සුවිශේෂ වශයෙන් හුවා දැක් වේ.

Etimos ග්‍රීක් අර්ථය-true සත්‍යය සහ logos; suffix - ප්‍රත්‍යය - study or logic හැදෑරීම) හෙවත් මූල සංකේතය –වචනයක සැඟවුණ අර්ථය සොයා ගත හැකිවන්නේ එහි මූලය දක්වා සොයා යාමෙනි. වචනයක පෙර සහ පසු යෙදී ඇති ප්‍රකෘති සහ ප්‍රත්‍යය ඔස්සේ නිශ්චය අර්ථ විග්‍රහයන්ගෙන් පසු එහි නිරුක්තිය හමුවේ. (පදාන මවයවාර්ථඃ සම්භාවිතානිර්දේශේන නිශ්චයේන උච්‍යතේ-වාචස්පත්‍යම්) (Tarkavachaspati, 2012; Trikamji, 2005) (*Padānamayavārthah sambhāvithānirdeshan nishchayen uchahthe-vāchaspathym*). එම ක්‍රියාවලියේ දී ව්‍යාකරණයකින් විග්‍රහ වන අර්ථය හමුවේ. ඒ අනුව ව්‍යුත්පත්ති වූ වචනය එයට යෙදේ. ඉතා පැහැදිලි එම හේතුව පදනම් කරගනිමින් පෞරාණික සංදර්භ සංවේදීවූ බහුශබ්දාර්ථයෙන් යුත් පද පශ්චාත් පුනර්ජීවන (post-Renaissance), පශ්චාත් වෙසිලියානු (post-Vesalian) සහ පශ්චාත් හාවීරියානු (post-Harverian) මනෝ විහිතියෙන් අර්ථ නොගැන්වීමට සැලකිලිමත් විය යුතු වේ (Bhattacharya, 2015).

අංග අටකින් යුතු ආයුර්වේද ශාස්ත්‍රයෙහි එක් එක් විෂය කොටස්වල හමුවන කේත පද භාවිතයෙන් ඒවා යෙදීමෙන් අරමුණු කරගත් භාවාත්මක හා තර්කාත්මක ඥාන උද්දීපනයක් සඳහා පද නිරුක්තකරණය එක්තැන් කර භාවිත වූ බවක් මේ දක්වා විෂය කරුණු අධ්‍යයනයේදී හමු නොවේ. මෙය ආයුර්වේද යෙහි එක් එක් අංග සම්බන්ධයෙන් වෛද්‍ය ශිෂ්‍යයකු තුළ වර්ධනය විය යුතු විෂයානුගත තාර්කික ඥාන පරිචයක් ගොඩ නැගීමට බාධා වේ.

ආයුර්වේද සංහිතා අධ්‍යයනයේ දී ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය හා ව්‍යූහය විග්‍රහ වන සහ එමෙන් ම ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ ස්වභාවය පිළිබඳ සංහිතා ගත කරුණු විග්‍රහයක් ඇති නාම පද සමූහයක් මෙම අධ්‍යයනයේදී හමුවන අතර මෙම ශාස්ත්‍රීය ලිපිය මගින් එම පද සාකච්ඡාවට භාජනය වේ. තවදුරටත් එහි ශරීර රචනා අර්ථකථන ඉස්මතුවන භාව අර්ථ සහ සන්දර්භාත්මක විග්‍රහයක් මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ. එමෙන්ම මෙම අංශ සම්බන්ධයෙන් සංහිතාගත ශරීර රචනා සහ ශරීර ක්‍රියා සම්බන්ධ අර්ථ විග්‍රහ මෙම අධ්‍යයනයේදී ඉදිරිපත් කෙරේ. ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය ඊට අයත්, පැලෝපීය නාල සහ සෙසු උපාංගවලින් සමන්විත වන අතර එහි ප්‍රධාන භෞතවිද්‍යාත්මක ශරීර ක්‍රියාව, පැලෝපීය නාල සහ *ඩිම්බ* කෝෂ මත රදා පවතී. අතිරේක හෙවත් සෙසු උපාංග (accessory organs) ආර්තව නිපදවීමට, ගර්භය ස්ථාපනය කිරීමට නියමිත කාලයෙහිදී එකී තත්ත්ව දෙකෙහි නිකුත්ව යාමට ආධාර වේ.

ඒ අනුව ස්ත්‍රී ප්‍රජනක පද්ධති යේ සෙසු උපාංග (accessory organs) මෙහිදී දක්වන ලද ප්‍රධාන ක්‍රියා සඳහා ඍජු ව සම්බන්ධ නොවන බැවින් ඊට අදාළ පද නිරුක්ති පිළිබඳ වැඩි වශයෙන් සංහිතා සහ ටීකා ග්‍රන්ථගතව භාවිත නොවන බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම අධ්‍යයනයේදී ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ ආධාරක උපාංග (accessory organs) සම්බන්ධවද කෝශ ග්‍රන්ථවලින් හෙළිවන පද විග්‍රහයක් ද මූලික ග්‍රන්ථයන්හි ඇති විග්‍රහයන්ට අමතර වශයෙන් ඉදිරිපත් කිරීම තවත් අරමුණක් ලෙස සැලකේ. තවද, ආයුර්වේද විෂයෙහි නිරුක්තිගත සෞන්දර්යාත්මක, සොබාපරිසරාත්මක සහ ආධ්‍යාත්මික පැතිකඩ වලින් යුතු කේතික භාශා විග්‍රහය එකී අධිප්‍රජානන (epistemic cognition) සමබරිත චිකිත්සා පෞරුෂයක් විද්‍යාර්ථීන් කෙරෙහි ජනිතවන්නේය යන නිරාමිස අරමුණ ද මෙම පර්යේෂණ යට පාදක වේ.

## 02. පර්යේෂණ ක්‍රමවේදය

### 2.1 පර්යේෂණ සැලසුම හා ප්‍රවේශය

මෙම අධ්‍යයනය ආයුර්වේද සංහිතා ග්‍රන්ථවල සඳහන් ස්ත්‍රී ප්‍රජනක පද්ධතියට අදාළ පාරිභාෂිත පද විශ්ලේෂණය කිරීම සඳහා ඥාන විභාගාත්මක (Epistemological) සහ නිරුක්ති විද්‍යාත්මක (Etymological) ප්‍රවේශයක් යොදා ගන්නා ලදී. මෙහි මූලික අරමුණ වූයේ සම්භාව්‍ය ආයුර්වේද ග්‍රන්ථවල භාවිතා වන පාරිභාෂිත පදවල නිරුක්තිමය විග්‍රහයන් මඟින් ඒවායේ වලංගුතාව (Epistemological validation) තහවුරු කිරීම සහ පැහැදිලි කිරීමයි.

### 2.2 දත්ත තෝරාගැනීම (අන්තර්ගත හා බාහිර නිර්ණායක (Data Selection - Inclusive and Exclusive Criteria)

මෙම අධ්‍යයනය ස්ත්‍රී ප්‍රජනක ව්‍යූහය හා කායික විද්‍යාවට අදාළ ප්‍රධාන පද 27ක් විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

දත්ත තෝරාගැනීමේදී පහත නිර්ණායක අනුගමනය කරන ලදී:

**අන්තර්ගත නිර්ණායක** (Inclusive criteria); ආයුර්වේදයේ ප්‍රධාන සම්භාව්‍ය සංහිතා (චරක සුශ්‍රැත අෂ්ටාංගහෘදය සහ කාශ්‍යප) හමුවන ප්‍රධාන ප්‍රජනක අවයව සහ ගර්භ කාලයට පමණක් (කලල විකසනයේ මූලික අවධීන්ට අදාළ) සීමාවී පවතින අංග ඇතුළත් සියලු තාක්ෂණික පද මේ අධ්‍යයනයේදී නිරුක්තකරණයට මූලික ව ම අන්තර්ගත කොටගෙන ඇත.

බාහිර නිර්ණායක (Exclusive Criteria): එවැනි නිරුක්තකරණය හසු නොවන *ආර්තව ප්‍රණාල, ඩිම්බ කෝෂ, ඩිම්බ* සහ *යෝනි ඕෂ්ට* සඳහා නිරුක්ති වෙන් වශයෙන් සාකච්ඡාවට ගෙන නැත (Exclusive criteria) ඒ අනුසාරයෙන් මෙම අධ්‍යයනයේ සීමා දක්වා ඇත.

### 2.3 දත්ත විශ්ලේෂණය හා අර්ථ නිරූපණය (Data Analysis and Interpretation)

තෝරාගත් පද නිරුක්තිකරණයට (Etymological Analysis) ලක් කිරීමෙන් විශ්ලේෂණය සිදු කරන ලදී.

1. සාහිත්‍ය සංස්ලේෂණයː ඓතිහාසික විචාරකයන් සහ සමකාලීන විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද නිරුක්තිමය විග්‍රහයන් මෙම අධ්‍යයනය සඳහා සම්පාදනය කර ඇත.
2. සංසන්දනාත්මක විශ්ලේෂණයː පදවල නිරුක්තිය සහ අර්ථය නිශ්චය කර ගැනීම සඳහා ඒවා නිරුක්ති කෝෂ, සම්භාව්‍ය ටීකා සහ මුල් සංහිතා ග්‍රන්ථයන්හි ඇතුලත් ස්ථාන

සහ පරිච්ඡේද සමග සසඳා බැලීම සිදු කර ඇත.

3. ප්‍රතිඵල ඉදිරිපත් කිරීම: විශ්ලේෂණය කරන ලද නිරුක්තිමය පද, අදාල නිරුක්ති ඔස්සේ සාකච්ඡාව ට බඳුන් කරමින් ඒවායේ ග්‍රන්ථගත ස්ථානය සහ නිරුක්තිකරණයන් එකකට වඩා වැඩි පද සංක්ෂේපිතව වගුගත කොට ඉදිරිපත්කර ඇත.

## 03. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 පද නිරුක්තකරණය

මෙම ශාස්ත්‍රීය පර්යේෂනයෙහි ආයුර්වේද සංහිතා ග්‍රන්ථගත ස්ත්‍රී ප්‍රජනක ව්‍යුවහාවේ නිරුක්ති 22ක සංඛ්‍යාවක් නිරුක්තකරණයට ලක් කර ඇත. ඒ අනුව එම නිරුක්ති විග්‍රහ ග්‍රන්ථ ගත ස්ථානය, සහ නිරුක්තකරණ සංක්ෂේපය මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් විග්‍රහිත නිරුක්ති සාරාංශය වෙන් වශයෙන් වගු ගත කොට ඇත.

පද නිරුක්ති නිරුක්තකරණය කෝශ ග්‍රන්ථ සහ ආයුර්වේද ග්‍රන්ථ ගත කරුණු මෙන් ම ඊට අදාළවූ පර්යේෂක විග්‍රහය ද එම නිරුක්ති පදය විග්‍රහ ස්ථානයෙහිම සාකච්ඡා කර ඇත.

සාමාන්‍ය ව්‍යවහාරයේ *ගර්භ* යන්න කුහරයක් යන අදහස ඇතත් ගර්භයෙහි ක්‍රියාවට අදාළ ව පද නිරුක්ති වශයෙන් ආශය සහ නිකේත යන ස්‍රොතස් සමරූපී පද ඇසුරින් *ගර්භ* නිරුක්ති සැපයිය හැකිවේ. (Sharma & Dash, 2003) ඊට සමාන වශයෙන් ආයුර්වේද ග්‍රන්ථවල ජෛන, මහායාන, සංස්කෘත ශබ්දකෝශවල එය නමින් ද, වාස්තු ශාස්ත්‍රය (Architecture) සහ ශිල්ප ශාස්ත්‍ර (Iconology) විෂයයන්හි *ගර්භ* පදය විග්‍රහ කරන්නේ අනුපිළිවෙළින් පාදම සහ කුටීරයක මධ්‍යය වශයෙනි. (Wisdom Library, n.d.) ඒ අනුව *ගර්භ* යන පදය ශරීර අවයවයක් වශයෙන් එහි හට ගැනීමේ විග්‍රහයට අනුකූල වනසේ කළල, විද්‍යාත්මකවත් පංච භූතාත්මකවත් වර්ධනය වන ස්ථානයක් වශයෙන් පද අර්ථ ඔස්සේ නිශ්චය කළ යුතුවේ.

**වගු අංක 01: ගර්භ** පද **විග්‍රහ** සංක්ෂේප

| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
|---|---|---|
| ***ගර්භ* Uterus** | | |
| | ආයුර්වේද ජෛන, මහායාන, සංස්කෘත ශබ්දකෝශ | *ගර්භාශ* අර්ථ විග්‍රහය. |
| | වාස්තු ශාස්ත්‍ර (Architecture) | පාදම |
| | ශිල්ප ශාස්ත්‍ර (Iconology) | කුටීරයක මධ්‍යය |
| | සුශ්‍රැත ශරීර Shaareera 4/29 | සැකසීම සම්බන්ධය විග්‍රහය |
| | සුශ්‍රැත ශරීර 5/8 | ස්ත්‍රීන්ගේ අටවන ආශය |
| | සුශ්‍රැත ශරීර 3/4 | අග්නි සෝම මිශ්‍රවන ස්ථානය |
| | චරක ශරීර 4/5 | ශුක්‍ර ශෝණිත සහ ජීව (ආත්මා) *කුක්ෂි* තුළ වන සංයෝගය *"ගර්භ"* |
| | සුශ්‍රැත ශරීර 3/2 | පංච භූත සම්බන්ධයෙන් ශරීරය හට ගන්නා ස්ථානය |
| | සුශ්‍රැත ශරීර 5/3 | පංච විංශති තත්ත්ව එකතුවන ස්ථානය |
| | වෘද්ධ වාග්භට | *කුක්ෂි* තුළ සිදුවන ශුක්‍ර ශෝණිත ආත්මා සමග මිශ්‍ර වීම.<br>මනසෙහි ඇති "රාග" හි බලපෑමෙන් පූර්ව ජන්ම කෘත කර්ම අනුව *ගර්භය* හට ගැනීම. |
| | සුශ්‍රැත ශරීර 5 /44<br>භාවප්‍රකාශය 5/56<br>චරක සංහිතා චක්‍රපාණිදත්ත ටීකා | ගර්භාශ ආකෘති රූපාදර්ශ විග්‍රහය |

*ගර්භ* පදය (Sharma, 2000, Vol. 2, Ch. 4/29, p. 155) කලලය වශයෙනුත් ආශය යන්න එය රඳන ස්ථානය වශයෙනුත් සලකා යන පදය ව්‍යුත්පන්න කොට ඇත. (Singhal & Yadav, 2021). සුශ්‍රැත ශාරීර ස්ථාන පස්වන අද්‍යායට අනුව ආශය සකස් වන්නේ වාත දෝෂය අනවරත ව ස්ථාන ගත වීමෙනි. ස්ත්‍රීන්ගේ අටවන ආශයයි.

යනු අග්නි, සෝම විශ්ව ශක්තීන් දෙක එක්තැන් කරන පූජනීය ආශ්‍රමයක් ලෙස විශ්වාස මගින් ඉදිරිපත් කරනු ලබන සංකල්ප විග්‍රහයක පද නිරුක්ති වශයෙන් ඉදිරිපත් කර ඇත. එනම් අග්නි

සෝම සම්මිශ්‍රණය යථා පරිදි සිදුවීම නිසා ගර්භය හට ගන්නා බවත් අග්නි යනු උෂ්ණ ස්වරූප වූ ආර්තව හෙවත් *ඩිම්බය* වන අතර සෝම යනු ද්‍රව ස්වරූපිත සිසිල් ගුණ යුතු ශුක්‍ර ලෙසත් තවදුරටත් පැහැදිලි කරයි (Puthiyedath, 2019). එමෙන් ම විශ්වයේ සියලු අංග ප්‍රධාන වශයෙන් වෙන් වන්නේ අග්නි සෝම වශයෙනි. මෙය ද්විත්වවාදය හෙවත් dualism ලෙස සාංඛ්‍ය දර්ශනයේ විග්‍රහවන අයුරින් ධූරාවලියකින් සිදුවන්නාවූ ද්‍රව නිෂ්පත්තියේදී සිදුවන්නාවූ ගුණපරිණාමයකි (Britannica, n.d.). මෙකී ප්‍රධාන ගුණ දෙක දේශීය සිංහල වෛද්‍යවරු ආහාර ඖෂධ නියමයන්හි භාවිත කරති.

ආචාර්ය චරකට අනුව ශුක්‍ර ශෝණිත සහ ජීව (ආත්මා) *කුක්ෂි* තුළ වන සංයෝගය *ගර්භ* නම් වේ. (Sharma, & Dash, 2003: Sharma, 2000) ආචාර්ය සුශ්‍රැත ශරීර ස්ථාන 3/2 ට අනුව පංචමහ භූත එකිනෙක සම්බන්ධ වීමෙන් ගර්භය සම්භව වේ. (Sharma, 2000) සුශ්‍රැත ශරීර ස්ථාන 5/3, (Sharma, 2000) අනුව ශුක්‍ර ශෝණිත තුළදී තවදුරටත් ප්‍රකෘති (අෂ්ට ප්‍රකෘති) සහ විකාර (ෂෝඩස විකාර) ආත්මා සමග එකට සම්බන්ධ වීමෙන් ගර්භය හට ගනී. වෘද්ධ වාග්භට (Aathvale, 1980) චරක මතය තහවුරු කරමින් රාග හි බලපෑම සහ පූර්ව ජන්මකෘත කර්ම අනුව ජීව වෙත මනස මගින් කරනු ලබන ආරාධනය ඔස්සේ *කුක්ෂි* වෙත පැමිනීමෙන් *ගර්භ* හටගනී (Sharma, 2000).

ආයුර්වේදයේ සඳහන් ගර්භාවක්‍රාන්ති විග්‍රහය නවීන කලලවිද්‍යාත්මක විග්‍රහය සමග සමානතාවක් ඇතත් ගර්භාවක්‍රාන්ති යනු ගර්භය හට ගැනීමේ ක්‍රියාවලියට ඉතා පුළුල් අර්ථ විග්‍රහයක් ඉදිරිපත් කරන පද යුගලකි. ඒ අනුව ගර්භවක්‍රාන්ති නමින් විග්‍රහ වන්නේ මව්පිය සාධක සම්බන්ධ වීම, රෝපණය වීම, අනුපිළිවෙළින් වර්ධනයවීම මගින් පූර්ණ කාලික ප්‍රසවයකින් අවසාන වන විග්‍රහයකි. ගර්භ සහ අවක්‍රාන්ති පද යුගලය ව්‍යාකරණාර්ථ විග්‍රහයට අනුව ජීවය ගැන්වුණු කාල-පරිනත *ගර්භ* ශරීරයක කල එළි බැසීමකි.

ගර්භාශයේ ස්වරූප විග්‍රහයේදී (morphology) රෝහිත මත්ස්‍ය මුඛාකෘති ලෙස දක්වා උපමා සහිතව භාව ප්‍රකාශය සහ සුශ්‍රැත ශාරීරස්ථාන පස්වන අද්‍යායේ 44 ශ්ලෝකයෙහිද (Shastri 2009: Sharma, 2000) දක්වයි. අල්පමුඛ එමෙන්ම අන්තර් මහා සුශිර (Bala et al., 2020) යන පද විග්‍රහයෙන් බලපොරොත්තු වන්නේ තවදුරටත් ගර්භාශයේ හැඩය සම්බන්ධව අවබෝධය තහවුරු කරදීම සඳහාය. [අල්පමුඛ කුඩාවූ විවරය සහ අන්තර් මහා සුශිර යනු ඇතුලෙහි පිහිටි විශාලණය වූ අවකාශය] එසේම සුශ්‍රැත විසින් රෝහිත මත්ස්‍ය මුඛ සමාන කරනු ලැබ ඇත්තේ එහි ඇති ත්‍රිකෝණාකාර හැඩය නිසාය. චරක සංහිතා ටීකාකාර චක්‍රපාණිදත්තට අනුව ක්ෂුද්‍රතුම්බී ඵල සමාන බව දක්වයි. පාඨයේ එසේ දක්වන්නේ එහි මුඛ විවරය පහළට හැරී ඇති අතර මුඛ ස්වරූපය පැතලි හැඩ ගැනීම නිසා බව නව්‍ය විමර්ශකයන් විසින් චරක ශාරීර තෙවැනි අධ්‍යායේ ඇති ශ්ලෝක පාඨයක් උද්ධෘත කොට දක්වනු ලැබ ඇත (Bala et al., 2020).

උපමා දෙකකින් යුතුව ගර්භාශ හැඩය විග්‍රහ කර ඇත්තේ උපමාණ ප්‍රමාණය භාවිත කරමින් වෛද්‍ය ශිෂ්‍යයාගේ රූපවිද්‍යාත්මක ඥාන අවබෝධය පුළුල් කරලීම සඳහා වේ.

**වගු අංක 02: ක්ෂේත්‍ර** පද **විග්‍රහ** සංක්ෂේප

| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
|---|---|---|
| ***ක්ෂේත්‍ර*** | | |
| | භගවද්ගීතා | ආත්මා ක්‍රියාත්මක වන ප්‍රදේශයි |
| | කුමාරසම්භවඃ කාලිදාස විරචිත සංස්කෘත මහා කාව්‍යය (6.(77):6) වැනි සර්ගයේ 77 වැනි පද්‍යය | ශරීරය, බිරිඳ සහ ප්‍රදේශය |
| | කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය | බීජ රෝපන ස්ථානය |
| | මනුස්මෘති | ස්ත්‍රිය / ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය |
| | භගවද්ගීතාව | පංච විංශති තත්ත්ව එකතුවන තැන |
| | අමරකෝශ | ක්ෂේත්‍රඥ වැතිර සිටින ස්ථාන |
| | අද්වෛත වේදාන්ත (භගවද්ගීතාව) | *ක්ෂේත්‍ර* සහ ක්ෂේත්‍රඥ |
| | චරක ශරීර 5 | ජීවාත්මා සූක්ෂම ශරීරයෙන් යුතුව ජීවීන් තුළ "*ක්ෂේත්‍ර*" සපයා ගන්නා ස්ථානය |
| | චරක චිකිත්සා 30 ස්ථානය | *ක්ෂේත්‍ර* විකෘති |

| | | |
|---|---|---|
| | සුශ්‍රැත ශරීර 2/ 33 | චතුර්විධ *ගර්භ* උත්පත්තිකර භාව |
| | චරක විමාන 3 ස්ථානය | දෘෂ්ඨ දේශ විග්‍රහය |
| | සුශ්‍රැත ශරීර 2 | ආත්මාගේ නිවහන |
| | සුශ්‍රැත ශරීර 2 | *කලල* රෝපණ ස්ථානය |
| | සුශ්‍රැත ශරීර 2/33 | ස්ත්‍රී පුරුෂ බීජ ඵල දරන තැන |

*ක්ශේත්‍ර* යන පදය සංස්කෘතයෙන් *ක්ශේත්‍ර* :**क्षेत्र**) මූලවාචී වේ.සන්දර්භානුකූලවූ අර්ථ විග්‍රහයන් බොහෝ ඇත. හින්දු විග්‍රහයට අනුව සාහිත්‍යාර්ථය වශයෙන් පූජාභූමිය, ශරීරය, බිරිඳ සහ ප්‍රදේශය යනු වෙන් ගැනේ (Kālidāsa, n.d., Canto 6, verse 77). *Kṣetra* (**क्षेत्र**) (lit.‘field’ or ‘area of ground’) මෙය භගවද් ගීතා අනුව ආත්මා ක්‍රියාත්මක වන ප්‍රදේශ යි. (*Bhagavad Gita*, n.d., Bombay ed., Chapter 13, verses 1-3) කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයට අනුව *ක්ශේත්‍ර* යනු බීජ උපද්නා (රෝපන) ස්ථානයයි (Wisdom Library, n.d.).

මනුස්මෘති විග්‍රහයට අනුව ස්ත්‍රිය *ක්ශේත්‍රයක්* බවත් පුරුෂයා බීජ ලෙසත් එසේම අව්‍යාපන්න (නිරෝගී) *යෝනි* හෙවත් ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය *ක්ශේත්‍රයක්* වශයෙන් ගර්භධානයේදී ක්‍රියා කරන බවත් දක්වයි. (Gulati et al., 2020). භගවද් ගීතාවට අනුව පංච භූත, අහංකාර, අව්‍යක්ත, පංච බුද්ධි ඉන්ද්‍රිය, පංච කර්ම ඉන්ද්‍රිය, මනස පංච ඉන්ද්‍රිය අර්ථ එකතුව කේෂත්‍ර නම් වේ (Gayathri & Meenakshi, 2015).

*ක්ශේත්‍ර* යන පදය ආත්මා හෙවත් පුරුෂ (ක්ශේත්‍රඥ) වැතිර පවතින වපසරිය ලෙස අමරකෝශ විග්‍රහයේ දැක්වේ. ආත්මා විවිධ හැඩ ඇති *ක්ශේත්‍රයන්හි* නිවහන කරගනිමින් අතීත කර්ම භුක්තිවිඳ ගනිමින් කර්ම ක්‍ෂය කරමින්ද කර්ම රැස්කරගනිමින් ද අනවරත ගමනක යෙදේ. යම්විටෙක ගැබක පිලිසිඳ ගනීද එවිට එම ගැබිනිය *ක්ශේත්‍ර* දෙකක උරුමයක් ප්‍රසවය දක්වා පවත්වා ගනී.

තවදුරටත් දර්ශන අධ්‍යයනයේ දී (Advaita Vedanta, 2008) විග්‍රහ වන්නේ ජීවාත්මා සූක්ෂ්ම ශරීරයෙන් යුතුව ජීවීන් තුළ *ක්ශේත්‍ර* සපයා ගන්නා අතර පරමාත්මා මුළු විශ්වය සිය *ක්ශේත්‍රය* වශයෙන් අත්පත් කර සිටින බවය (Sharma & Dash, 2003).

ගර්භාශය යන පදය සඳහා *ක්ශේත්‍ර* යන පද නිරුක්තිය, චරක චිකිත්සා තිංශත් අධ්‍යායේ විංශති *යෝනි* ව්‍යාපත් විග්‍රහයෙහි ගර්භාශයේ *කලල* රෝපන අයෝග්‍යතාව පැහැදිලි කිරීම සඳහා *ක්ශේත්‍ර* විකෘති පිළිබඳ විග්‍රහ කරමින් දක්වයි. එමෙන්ම එය චරක සංහිතා විමාන ස්ථානයෙහි (Sharma & Dash, 2003) දුෂ්ට දේශ විග්‍රහයට සමාන කර දක්වා ඇත.

*ක්ශේත්‍ර* යන පදය චතුර්විධ *ගර්භ* උත්පත්තිකර භාවයන්ගේ දෙවැන්න වශයෙන් නැවත උපමා රූපකයක් වශයෙන් ඉදිරිපත් කර ඇත. (Sharma, 2000, p. 134) එනම් සීසෑමෙන් පසු බීජ අස්වද්දන සරු කෙතක් වශයෙනි. සුශ්‍රැත ශාරීරස්ථාන දෙවන අධ්‍යායේ ශ්ලෝකයේ ක්ශේත්‍රඥගේ නොහොත් ආත්මාගේ නිවහන ලෙස සලකා *ක්ශේත්‍ර* පදය ගර්භාශය හැඳින්වීම සඳහා යොදා ගෙන ඇත. බීජයක් රෝපණය වන සරුබිමක් වශයෙ සලකා එය කලලයේ ස්ථාපනය, වර්ධනය සහ බිහිකිරීම සඳහා වෙන්වූවක් ලෙස තවදුරටත් විග්‍රහ කර ඇත. සුශ්‍රැත සංහිතා උපුටා ගනිමින් වෛද්‍ය පී වී තිවාරි විසින් රචිත වෘද්ධ ජීවකතන්ත්‍ර නම් කෘතියේ උද්ධෘත කර නැවත එම අදහසම ඉදිරිපත් කර ඇත (Tewari, 2018).

මේ අනුව ස්ත්‍රී බීජ සහ පුරුෂ බීජ ඵල දරන තැන *ක්ශේත්‍ර* හෙවත් *ගර්භාශය* වශයෙන් ප්‍රජනක ව්‍යුහය ඇසුරෙන් විග්‍රහ කළද ආත්මා වැතිර සිටින නිසා ගර්භාවක්‍රාන්තිය සිදු වන්නාවූත් (embryogenesis) එමෙන්ම ආත්මාගේ අතීත කර්ම ක්‍ෂය කරන්නාවූ සහ අතීත කර්ම ඵල දරන්නාවූ දින 280 හි කාලස්ථානයද *ක්ශේත්‍ර* වශයෙන් සැලකිය හැකිවේ.

**වගු අංක 03:** ක්ශේත්‍ර සමාන පද විග්‍රහ සංක්ෂේපය

| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
|---|---|---|
| ***අන්තර්ගත ඵලම්*** | ටීකාකාර ඩල්හන ඥානේකර් | ගර්භාශය<br>*ඩිම්බ* කෝශය |
| ***ගර්භ ආධාර*** | වාග්භට (අරුණ දත්ත (අරුණ දත්ත ටීකාව)<br>වාචශ්පත්‍යම් සංස්කෘත ශබ්දකෝශය | *කලල* රෝපණයට ආධාර දෙන ස්ථානය |

| | | |
|---|---|---|
| *ගර්භ **කෝෂ්ඨ*** | වාග්භට අෂ්ඨාංගසංග්‍රහ ශාරීරස්ථානයේ | ආර්ථව බැහැරවීම ආරම්භක-ගන්නා ස්ථානය |
| | චරක විමාන ස්ථානය | ස්‍රෝතස්හි නිරුක්ති අර්ථ කථනය |
| | චරක සුශ්‍රැත සහ ගුරුමුඛී ආයුර්වේද කෝශ | *කෝෂ්ඨය* - අභ්‍යන්තර රෝග මාර්ගය |
| ***ඵල*** <br> ***'ඵල යෝනි'*** | සුශ්‍රැත ශාරීර <br> සුශ්‍රැත සූත්‍ර 11 | ස්ත්‍රී ශරීරයෙහි පවත්නා අමතර දශ පේශි විග්‍රහය <br> ක්‍ෂාරකර්ම ප්‍රතිකාරය |
| *කුක්ෂි* | චරක ශාරීර 4 (P 389) | අමතර යෙදුමක් වශයෙන් ගර්භාශය හැඳින්වීම |
| | චරක ශාරීර 4( P 388) | ආත්මා, ශුක්‍ර, ශෝණිත සම්බන්ධ වන ස්ථානය.. |
| | චරක, (අන්තර් කුක්ෂි) | උපුටා ගැනීම (Gurmule, 2018) |
| | වෘද්ධ වාග්භට අෂ්ටාංගහෘදය සංහිතාව | "ජීව"*කුක්ෂි* වෙත පැමිණී මෙන් *ගර්භ* හට ගනී. |
| | කාශ්‍යප සංහිතාව | *ගර්භ* උත්පත්ති විග්‍රහය - "ජීව" ගේ පැමිනීම |
| | භාවප්‍රකාශ සහ යෝග රත්නාකර සංහිතා | උපුටා ගැනීම (නාහර් සහ ජවාලේ, 2022) |
| ***ධාරා*** | ශාරංගධර <br> කෝශ ග්‍රන්ථ | ස්ත්‍රීන්ගේ අටවන ආශය ගර්භාශය බව දක්වේ. ධර, ධාරා,ධාර, ධරා (රඳවා ගැනීම,රැගෙන යෑම, දරා සිටීම, පැළඳ සිටීම,අඩංගු කර තිබීම) |
| ***ගර්භ සයියා*** | වාග්භට <br> සුශ්‍රැත <br> කෝශ ග්‍රන්ථ | ගර්භාශය පිහිටීම. <br> ශයියා - සයනය |

***අන්තර්ගත ඵලම්***

අන්තර්ගත ඵලම් යන පදය ටීකාකාර වෛද්‍ය ඥානේකර් *ඩිම්බ* කෝෂ හැඳින්වීමට යොදා ගෙන ඇති අතර චරක සහ සුශ්‍රැත ටීකාකාර ඩල්හන එම පදය ගර්භාශය පදයට සමාන කොට ගෙන අර්ථ විග්‍රහය සිදුකර ඇත. (Gurmule & Lanjewar, 2018), *අන්තර්ගත ඵලම්* යන්න *ඵලම්* යන පදය ඔස්සේ විග්‍රහ කරගත යුතුවේ. එනම් මෙහි *ඵලම්* යනු *ඩිම්බ* නොහොත් ස්ත්‍රී බීජ නොවන බවත් ඇසට පෙනෙන ප්‍රමාණයේ ගෙඩියක් වැනි උපමා රූපකයක් බවත් යුක්ති ප්‍රමාණානුකූල ව සිතාගත යුතුය. ඒ අනුව එය බීජ අන්තර්ගත වූ ඵලයක් සඳහාම විය යුතු ය. මෙකී නිරුක්ත විග්‍රහයට අනුව *ඵලම්* යන පදය, දෙඵම් ගෙඩියක බීජ එකට රැස්වූ (අන්තර්ගත වූ) ඵලයක රූපාකාර ඇති අභ්‍යන්තර ශ්‍රෝණිය දෙපස පිහිටි *ඩිම්බ* කෝෂ දෙක සඳහා හෝ දරුවකු (අන්තර්ගත ව) වැඩෙන ගර්භාශය සඳහා හෝ වන බව මෙම පදය යෙදෙන අවස්ථාව අනුව සහ ව්‍යාකරණ ගැළපීම අනුව විග්‍රහ විනිශ්චය කරගත යුතුය.

එහෙත් සුශ්‍රැත ටීකාකාර භාරනචන්ද්‍ර විසින් පැලෝපියනාල සඳහා ද *අන්තර්ගත ඵලම්* පදය යොදනු ලැබ ඇත. එය ප්‍රජනන පද්ධතියේ පවතින නාලස්වරූපවූ උපාංගයක් බැවින් රූපාකාරයෙන් හෝ ක්‍රියත්මක වන ස්වරූපය ඇසුරෙන් හෝ මෙම පදය විග්‍රහ කළ නොහැක.

එහෙත් අද්‍යාස ප්‍රමාණාත්මක චින්තනයක් ඔස්සේ සුහුරු පරිකල්පනයක (deliberate reflection) යෙදීමේදී, ස්වයං විග්‍රහාත්මක ව ඉදිරිපත් කළ හැක්කේ, පැලෝපිය නාල හෙවත් ආර්ථව ප්‍රණාල, ඵල වෘන්තයක සදෘශත්වය ඇසුරින් විග්‍රහකොට භාරනචන්ද්‍ර විසින් පැලෝපියනාල සඳහා ද *අන්තර්ගත ඵලම්* යන යෙදුම ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ හැරෙන්නට වෘන්තය හා ඵලය එක් ඒකකයක් ලෙස සලකා ගැනීමෙන් හැරෙන්නට පැලෝපියනාල හෙවත් ආර්තව ප්‍රණාල සඳහා *අන්තර්ගත ඵලම්* යෙදුම යෙදීමේ සමානත්වයක් දැකිය නොහැකිවේ.

ගර්භාශයට ඉතා සමීප ව පවතින අවයව ලෙස "*විපුල ඵල සෝත්‍රස් කුණ්ඩල*" එනම් කුඩාඅන්ත්‍ර වශයෙන් සුශ්‍රැත (Sharma, 2000) සහ කාශ්‍යප (Tivari, 1996) සංහිතාගත විග්‍රහ කිරීම් වරදවා ඉදිරිපත් කරමින් මෑතකාලීන විශ්ලේෂකයන් විසින් විපුල ඵල සෝත්‍රස් කුණ්ඩල යනු ගර්භාශය බව දක්වනු ලැබ ඇත. කුණ්ඩල යනු එකමත වෙළුණු රැහැනක ආකෘතිය සඳහා යෙදුනු නමක් බැවින් සහ එම හැඩයෙන් වියුක්ත අවයවයක් වන බැවින් සුශ්‍රැත සහ කාශ්‍යප විග්‍රහය නිවැරදිවේ.

***ගර්භ ආධාර*;**

ගර්භාශය සඳහා *ගර්භ ආධාර* යන පද දෙකේ එකතුව ගර්භාශය නමින් නිරුක්ති කර ඇත්තේ සංසේචිත *ඩිම්බය* (කලලය) රෝපණය සඳහා ආධාර වන සහ වර්ධනය සඳහා නිකේත වන ස්ථානය වශයෙනි. එය අෂ්ඨාංගහෘදය සංහිතා අරුණදත්ත ටීකා උද්ධෘත කොට නිරුක්ත සැපයීමෙන් මෑතකාලීන විශ්ලේෂකයන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. (Bala et al., 2020) එමෙන්ම ගර්භාශය යනු *ගර්භ ආධාර* හෙවත් වැඩෙන කලලයට ආධාර සපයන ස්ථානය ලෙස වාචස්පත්‍යම් සංස්කෘත ශබ්දකෝශය දක්වා ඇත. (Tarkavachaspati, 2012) ඒ අනුව වැඩෙන ගර්භයට ආධාර සපයන අර්ථ වැටහෙන පද යුගලකින් *ගර්භාශ* පදය නිරුක්ති කරඇත. මෙම විග්‍රහය මෑතකාලීන ආයුර්වේද විමර්ශකයන් විසින් සිය පර්යේෂණ අධ්‍යයනයන්ට භාවිත කරනු ලැබ ඇත. (Gurmule & Lanjewar, 2018) මෙය තනි පද නිරුක්තිකරණයක් වශයෙන් මෙන්ම *ගර්භ ආධාර* ද්විපද නිරුක්තියේ පෙර අපර 'අ' අක්ෂර සන්ධි වූ පද යෙදුමක් වශයෙන් ද හඳුනා ගත හැකිවේ.

***ගර්භ කෝෂ්ඨ*;**

ගර්භාශය සඳහා වාග්භට ආචාර්යවරයා අෂ්ඨාංගසංග්‍රහ ශාරීරස්ථානයේ ආර්තව විග්‍රහයේදී, දින තුනක් තිස්සේ ගර්භකෝෂ්ඨයෙහි සිට බැහැරවන රුධිරය ආර්තව ලෙස අර්ථකථනය කර ඇත. (Gurmule& Lanjewar, 2018). මෙහි ගර්භකෝෂ්ඨ පදය ගර්භ සහ කෝෂ්ඨ යන පද දෙකේ එකතුවෙන් යොදා ඇත. මෙහි ගර්භ යනු කලලය ලෙසත් කෝෂ්ඨ යනු ආධාරක, හෙවත් නිකේත (Sharma & Dash, 2003) ලෙසත් චරක ස්‍රෝතෝ විමාන ස්ථාන කෝෂ්ඨ විග්‍රහයට අනුව සලකා ගත යුතුවේ. ඒ අනුව කෝෂ්ඨය නම් මතුවට එහි හටගන්නා කලලය රැඳවීම සඳහා වෙන් වූ ස්ථානයක් වශයෙන්ද ගර්භ පද අර්ථ සාම්‍යය ගෙන දෙන්නාවූ ප්‍රත්‍යක්ෂ කාල ක්‍රියා අර්ථයෙහි යෙදෙන සමානවාචී පද යෙදුමක් බවද විනිශ්චය කළ යුතුවේ. ගර්භාශය (ගර්භ+ ආශය) සඳහා යෙදෙන පද ව්‍යුත්පන්නයෙහි දී ද මෙම විග්‍රහය අදාළ වේ. ගුරුමුඛී ආයුර්වේද කෝශගත අර්ථයට අනුව (Wisdom Library, n.d.) කෝෂ්ඨ යනු අභ්‍යන්තර රෝග මාර්ගය ද වේ. එමෙන්ම වැසුණු අවකාශය යන අර්ථයෙන්ද, උදර, පපු සහ ශ්‍රෝණි කුහර යන්නෙහිද කෝෂ්ඨ පදය යෙදේ. මෙය ද්විපද නිරුක්තිකරණයක් මෙන්ම පද දෙක වෙන් වශයෙන්ද කෝශාර්ථ සපයයි.

***ඵල සහ ඵල යෝනි*;**

*ඵල* - යන පදය සුශ්‍රැත ශාරීර ස්ථානයේ අධ්‍යාය 5/44 (Sharma, 2000) යෙදෙන්නේ *ගර්භාශ* පදය වෙනුවෙනි. මෙන්ම එය ස්ත්‍රී ශරීරයෙහි පවත්නා අමතර දශ පේශී විග්‍රහයෙහිද උද්ධෘත කර ඇත. ඵල යෝනි පදය සුශ්‍රැත සංහිතා සූත්‍ර 11 වෙනි අධ්‍යායේ 28 ශ්ලෝකයෙහි ප්‍රතිකාරයක් වශයෙන් ක්ෂාරකර්ම යෙදීමේ අන්තරායකර තත්ත්වය විග්‍රහයේදී එම කර්මය *උද්වෘත ඵල යෝනි* සහ *අපවෘත ඵල යෝනි* (displacement of uterus) තත්ත්වයන්ට නුසුදුසු බව දැක්වීමට ඵල *යෝනි* පද ව්‍යුත්පන්නය යොදා ගෙන ඇත. ඒ අනුව *ඵල* පදය ගර්භාශය සඳහාත් *යෝනි* පදය *යෝනි* මාර්ගය සඳහාත් වෙන් වශයෙන් සැලකූ විට ගර්භාශයේ පිහිටීමෙන් *යෝනි* මාර්ගයෙන් ඉහළට සහ ඒ තුළට සිදුවන විස්ථාපනය බව පැහැදිලි වේ. ඒ අනුව *ඵල* පදය ගර්භාශය සඳහා යෙදුනු බව තීරණය කළ හැකිවේ. මීට අදාළ ව ආචාර්ය පී. වී.ශර්මා සුශ්‍රැත සංහිතා සූත්‍ර 11හි[1] වෙනත් අයෙක් නමින් උද්ධෘත කරමින් ඵල *යෝනි* පදය ගර්භාශයටත්, අනිකුත් අයෙක් නමින් ඵල යනු රජස් ලෙසත් අර්ථකරණ බවත් දක්වා ඇත.

*ඵල* යන පදය දරුපල යන සිංහල වචනය ඇසුරින් විග්‍රහ කිරීමේ දී ද සමාන සරල අර්ථයක් ලැබේ. *යෝනි* යනු හටගැනීම යන අර්ථයෙන් දරුවන් පිළිසිඳින තැන නැතහොත් නියමිත ඵලය ලැබෙන තැන මෙන්ම *ඵල යෝනි* පද දෙක වෙන් කර විග්‍රහ කිරීමේදී ඵලය හෝ ජීවී යමක් හට ගන්නා තැන *යෝනි* ලෙසත් විග්‍රහ කළ හැකිවේ. තවද, *යෝනි* යුජ් ධාතුව යුග්ම වීම අර්ථයෙහි යෙදෙන බැවින් සංවාසය ඔස්සේ ශුක්‍ර ශෝණිත යුග්ම වීම හේතු කොට ගෙන *ඵල* හට ගන්නා තැන *ඵල යෝනි* වශයෙන් පැහැදිලි කළ හැකි ය.

ඒ අනුව *ඵල* සහ *යෝනි* පද එකතුවෙන් අර්ථ උද්දීපනය කරමින් ගර්භාශය සඳහා යෙදුනු බව තීරණය කළ හැකිවේ.

***කුක්ෂි*;**

ආයුර්වේද බෞද්ධ ජෛන, මහායාන, සංස්කෘත ශබ්දකෝශ අර්ථ උදරය සඳහා ප්‍රධාන වශයෙන් ගැනෙන අතර දෙවනුව ගර්භාශය නිරුක්තියෙහි දී ඇත. එසේම කුහරයක අභ්‍යන්තරය නාමකරණයෙහිද කෝශාර්ථය දක්වා ඇත (Wisdom Library, n.d.).

*කුක්ෂි* පදය චරක ආචාර්යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. චරක සංහිතාවේ ශාරීර ස්ථානයට හතරවන අධ්‍යාය 3-4 ශ්ලෝක අනුව (Sharma, & Dash, 2003) අමතර යෙදුමක් වශයෙනි. එහිදී එකම අර්ථය ඉදිරිපත් කිරීම සිදු කරමින් අන්තර්- *කුක්ෂි* පද යෙදුම ගර්භාශය හැඳින්වීම සඳහා යොදා ඇති බව මෑත පර්යේෂකයන් විසින් (Gurmule & Lanjewar, 2018) උපුටා ගනිමින් දක්වනු ලැබ ඇත. වෘද්ධ

[1] तेन यस्याः योनेः सकाशात् फलं रज उद्वृत्तमूर्ध्वगतं अपवृत्तमधोगतम्, सा उद्वृत्तापवृत्तफलयोनिः [३] ||२८|| ("केचित्तु फलशब्देनेहान्त्रं ग्राहयन्त्युपचाराद्गङ्गायां घोष इतिवत्" -इति हाराणचन्द्रः|)

වාග්භට අෂ්ඨාංග හෘදය සංහිතාවට අනුව (Aathvale, 1980) ජීව (හෙවත් ආත්මා) *කුක්ෂි* වෙත පැමිණීමෙන් *ගර්භ* හට ගනී. (Shastri, 2010) *කුක්ෂි* පදය කාශ්‍යප සංහිතාවේ ද ගර්භ උත්පත්ති විග්‍රහයේදීද යොදා ගෙන ඇත. නාහර් සහ ජවාලේ විසින් *කුක්ෂි* පදය භාවප්‍රකාශ සහ යෝග රත්නාකර සංහිතා උපුටා ගනිමින් දක්වා ඇත (Nahar & Jawale, 2022).

***ධාරා*** **;** *ධාරා, ධර, ධාර,* සහ *ධරා* කෝශාර්ථ ගතව ඇත්තේ වචනයක අග ප්‍රත්‍යයක් වශයෙන් යෙදෙමින්, රඳවා ගැනීම, රැගෙනයෑම, දරා සිටීම, පැළඳ සිටීම,අඩංගු කර තිබීම, අයත් කර සිටීම යනාදී සමීපාර්ථ ප්‍රයෝගයේදීය (Wisdom Library, n.d.). ධාරා, පදය ප්‍රත්‍යයක් සේම දහරාව යන කේවල පදර්ථයේද යෙදේ. ඒ ආකාරයෙන්ම ධරා පදය පෘථිවි සහ පාර්ථිව වචන ද්වයෙහි මෙන්ම භෞතික විශ්වයේ දිව්‍යත්වය (වසුදේව) නාමකරණයෙහිද භාවිත වේ (Wikipedia contributors, n.d.).

*ධාරා*, පදය යොදා ගනිමින් ගර්භාශ විග්‍රහයේදී ශාරංගධර සංහිතාවේ (Tripathi, 2007) ස්ත්‍රීන්ට පවත්නා අමතර ආශයක් (Bala et al., 2020; Shrikantamurthy, 2004; Tripathi, 2007; Vagbhata, 1996) හෙවත් අටවන ආශය වශයෙන් කරුණු දක්වා ඇත.[2]

***ගර්භසයියා*** **;** පදය වාග්භට අෂ්ටාංගහෘදය සංහිතාවේ සහ සුශ්‍රැත සංහිතාවේ (Sharma, 2000)[3] දක්වා ඇතත් එහි ව්‍යාකරණ විග්‍රහයක් දක්වා නොමැත. (Gurmule & Lanjewar, 2018) නිදියෑමට ඇති සයනය විග්‍රහ කිරීමට සයියා යන පදය යෙදී ඇති අතර පෙර විග්‍රහයන්ට අනුව ගර්භ යනු වර්ධනය වන කලලය ලෙස සලකා *ගර්භසයියා* යනු ගර්භාශය සඳහා සමාන පදයක් ලෙස සලකා ඇති බව පැහැදිලි වේ. තවදුරටත් මෙම පදය විග්‍රහ කිරීමේදී ගර්භාශය අභ්‍යන්තර ආස්තරණය (Endometrium) ඇසුරු කර වැඩෙන කලලය පවත්වා ගෙන යෑමට උපකාරී වන නිසා නොහොත් වචනාර්ථ විග්‍රහයට අනුව කලලය කලල් දියෙහි පාවෙමින් සිට අනුක්‍රමික වර්ධනයත් සමග වැතිර ගනිමින් ප්‍රසූතිය දක්වා වැඩෙන තෙක් වැතිර පවත්නා සයනය ලෙස සයියා පදය විග්‍රහ කිරීම සුදුසුවේ. එහෙත් සංස්කෘත කෝශගත අර්ථය සපයා ඇත්තේ ශයියා පදයට වේ.*ගර්භසයියා* පදය සුශ්‍රැත යොදා ඇත්තේ ශරීරසංඛ්‍යාව්‍යාකරණශරීරෝපක්‍රම (5 වන) අධ්‍යායේ ගර්භ පිහිටීම සලකුණු කිරීම සඳහා බැවින් ගර්භ ස්ථානගතවීම මින් අදහස් කර ඇති බවද පැහැදිලිවේ.

එමෙන් ම *ශයියා* යන පදය සංස්කෘත කෝශ විග්‍රහයේ ඇතත් එය *සයියා* පදය නොවේ. ආයුර්වේද සංහිතා කතෘන් හෝ ටීකාකරුවන් එම පදය ගර්භ පදය සමග ඉදිරිපත් කළ ද එය භාව පූර්ණ යෙදුමක් ලෙස මිස එයට විස්තරාත්මක කරුණු ඉදිරිපත් කිරීමක් කර නැත. හේතුව ශයියා පදයට හැරෙන්නට සයියා පදයට කෝශාර්ථ නොමැති බැවිනි (Wisdom Library, n.d.).

***ඩිම්බ*** **;** යන පදය වාග්භට අරුණදත්ත ටීකාව උද්ධෘත කර පර්යේෂණ ලේඛන යන්හි, (Kumar & Kaur, 2020) ගර්භාශ පදයට සමාන කර ඇත. (Nagar et al., 2020: Gulati et al., 2020) සංස්කෘත කෝශාර්ථගතව ඇතත් ආයුර්වේද සංහිතා ග්‍රන්ථවල ඒ සම්බන්ධ පුළුල් විග්‍රහයක් හමු නොවේ.

ගර්භාශය නිරුක්ති සහ නිරුක්තකරණයේ දී ප්‍රධාන වශයෙන් ග්‍රන්ථගතව භාවිත වන්නේ ගර්භ පදය වේ. ගර්භ පදය කෝශ ග්‍රන්ථ ඇසුරින්ද විග්‍රහ සපයන අතර මෙහි අර්ථකථන ධර්මශාස්ත්‍ර ග්‍රන්ථ, සංස්කෘත කෝශ ග්‍රන්ථ, වාස්තු ශාස්ත්‍ර (Architecture) සහ ශිල්ප ශාස්ත්‍ර (Iconology) ග්‍රන්ථයන්හි සමාන වූ මූලික අර්ථයක් සහිතව නිරුක්ති සපයා ඇත. ශාරීර විග්‍රහාත්මක මෙන්ම විශ්ව නිර්මාණ විග්‍රහයට අනුව (Micro - Macro cosmic Evolution) ප්‍රධාන ගුණ සංයෝගයෙහි, උෂ්ණ සහ ශීත ප්‍රධාන ගුණ දෙක සම්මිශ්‍රණයෙන් සිදු වන්නා වූ ෂෝඩශ විකාර පරිණාමයේ පූජනීය ආශ්‍රමයක් වශයෙන් ද ආත්මාගේ පංචභූත විකසනය වන්නාවූත් එමෙන්ම ආත්මා දින 280 ක කාලයක් ගැබ තුළ රැඳෙමින් ස්වකර්ම ක්ෂය කරන්නාවූත්, බීජ ඵල දරන්නාවූත් ස්ථානය වශයෙන් ගර්භාශයෙහි පිහිටීම දැක්වීමේ දී විග්‍රහ වේ. තවද ස්ත්‍රීන්ට ඇති අමතර ආශයක් වශයෙන් රූපාදර්ශ (morphology) සැපයීමෙන්ද අවයවගත ක්‍රියාවේ විශ්ව සාමනකරණයෙහි ආධ්‍යාත්මික විග්‍රහයෙන්ද ගර්භ පදයට නිරුක්ත සපයා ඇත.

## ***යෝනි*** **- Vagina**

*යෝනි* -√යුජ් ධාතුව Link / join (යුග්ම වීම) අර්ථඇති *යෝනි* පදය අර්ථ විග්‍රහය සඳහා, (Gurmule & Lanjewar, 2018) (Acharya, 2005) පද විග්‍රහ (Grammer), ස්වරූප විග්‍රහ (Morphology) රචනා විග්‍රහ (Anatomy) සහ

---

2 स्त्रीणाांपनत्तनक्वाशयोर्ध्म येगर्मश्योऽष्टर्: ॥ (अ.स.शा. ५/४६)
Women possess an extra Ashaya called Garbhashya, which supports and bear growing fetus.

3 तत सम्स्थानम तथा रूपम गर्भा शय्याम विदुहु बुधाह (ref – सुश्रुता शारीर ५)

විකෘති විඥාන විග්‍රහ (Pathalogy) යටතේ කරුණු ඉදිරිපත් කෙරේ. තවද *යෝනි* පදය ඉංග්‍රීසි පදවල ප්‍රත්‍යයන් (suffixes) වශයෙන් යෙදී පද ව්‍යුත්පන්න කරඇත.

**වගු අංක 04:** යෝනි මාර්ගය පද විග්‍රහ

| **යෝනි මාර්ගය - Vajina** | | |
|---|---|---|
| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
| **අපත්‍ය පථ** | සුශ්‍රැත | *යෝනි* මග පේශී විවරණය |
| **ගර්භ පථ** | කාශ්‍යප | ගර්භය බැහැර වන මාර්ගය |
| **රක්ත පථ** | වාග්භට අෂ්ඨාංග සංග්‍රහ ශරීර 6 වන අධ්‍යායේ 12 | ස්ත්‍රීන්ට පවතින අමතර නාලයක් |
| **විශිකාන්ත** | සුශ්‍රැත ඩල්හන | ගර්භය බැහැරවීමට *යෝනි* මග පිළියෙල කිරීම.<br>අපත්‍ය මාර්ගය |
| **මනෝභාවසර** | භාව ප්‍රකාශ | *යෝනි* මග නාඩි විග්‍රහය |

වාග්භට ආචාර්යවරයා විසින් ස්ත්‍රී ජනේන්ද්‍රිය විග්‍රහ කිරීමේදී *යෝනි* යන පදය යොදා ඇත. එහිදී ඔහු ගර්භ පාත චිකිත්සා විග්‍රහයේදී විවිධ ඖෂධ යොදා ගනිමින්, *යෝනි*යෙහි පිචු ධාරණය කළයුතුබව දක්වයි. *යෝනි* සහ පිචු පද යුගලය එක ළඟ යෙදීමේ ප්‍රායෝගික අර්ථ ගැළපීම සිදු වන්නේ පිචු ධාරණය ප්‍රතිකාර වශයෙන් *යෝනි* මාර්ගය තුළ සිදු කරණු ලබන චිකිත්සාවක් මෙන් ම චිකිත්සාව දක්වනු ලබන සංහිතාගත අදායාය පදනමෙහි සිට විමර්ශනය කිරීමෙනි. පිචු ධාරණය ශරීර ගත රෝග සඳහා ස්ථානයට අදාළ ව සිදුවේ. එනිසා *යෝනි* යන පදය *යෝනි* මග හැඳින්වීම සඳහා බව පැහැදිලිවේ. ඇතැම් තැන්හි විශේෂ කරුණු මුල් කරගෙන *යෝනි* යන පදය ගර්භාශය හැඳින්වීම සඳහාත් වාග්භට ආචාර්යවරයා විසින් යොදනු ලැබ ඇත (Gurmule & Lanjewar, 2018).

***අපත්‍යපථ* ;** සුශ්‍රැත සංහිතා ශරීර ස්ථාන (5/37p179 ) *යෝනි* මග පේශී විවරණය දැක්වීමේදී (Sarma, 2000) අපත්‍යපථ යන පදය යොදා ඇත. එය අප විග්‍රහකරගතයුතු වන්නේ ගර්භ ආස්තරණයේ (endometrium) දින 28කින් පසු කල් ගිය පටක ඉවත් කරන මග නිසා අපත්‍යපථ ලෙස දැක්වීම බව වටහාගැනීමෙනි.

**ගර්භපථ;** සංසේචනයෙන් පසු දින 280 කින් බැහැර වන ගර්භයට මාර්ගය සපයන බැවින් ගර්භපථ ලෙස කාශ්‍යප සංහිතාවේ (Thivari, 1996) උපුටා ගැනීමෙන් පැහැදිලි කර ගත යුතුවේ.

**රක්ත පථ ;** පදය වාග්භට අෂ්ටාංග සංග්‍රහ ශරීර 6 වන අධ්‍යායේ 12 වන ශ්ලෝක පාඨයේ දැක්වෙන්නේ ස්ත්‍රී ස්‍රෝතස් විග්‍රහයේ දී ස්ත්‍රීන්ට පවතින අමතර නාලයක් වශයෙනි (Murthy, 2005).

**විශිකාන්ත ;** දින 280 සම්පූර්ණවීමෙන් පසුව ගර්භය බැහැර වන මාර්ගය සූදානම් කිරීම සඳහා පිචු සහිත තෛල අභ්‍යංගකරණය කළ යුතු මාර්ගය වශයෙන් දක්වමින් මෙන් ම ඒ සඳහා සේවිකාවන්ට දෙනු ලබන උපදෙස් දැක්වේමේදී විශිකාන්ත නම ගර්භ මාර්ගය හෙවත් යෝනි මග නම් කිරීම සඳහා යොදාගෙන ඇත. එම අදහස, සුශ්‍රැත සංහිතා ශරීර ස්ථාන 10 අදධ්‍යාය/11 ඩල්හන විසින් විශිකාන්ත යනු අපත්‍ය මාර්ගය ලෙසත (Shastri, 2009) විග්‍රහ කර කරනු ලැබ ඇත. එමෙන්ම සංස්කෘත විශි පද අර්ථ රූපයට අනුව (Wisdom Library, 2023) බොහෝ වේලාවක් රඳවා තැබිය හැකි අර්ථානුගත ව ආර්තව ප්‍රතිකාරය සඳහා විශේෂයෙන් ඖෂධ බොහෝ වේලාවක් රඳවා තැබිය හැකි යන්නාවූ යථාර්ථාවබෝධයෙන් *යෝනි* මග පිචු ධාරණයට පමණක් සම්බන්ධවූ වචනයක් ලෙස සාධාරණ විග්‍රහයක් කළ හැකිවේ.

**මනෝභාව සර;** මෙම පදය භාවමිශ්‍ර විසින් රචිත භාව ප්‍රකාශ සංහිතාවේ ගර්භ ප්‍රකරණ පරිච්ඡේදයෙහි භාවිත කර ඇත. මීට අදාළ ශාස්ත්‍රීය විශ්ලේෂණය කතුවරයා විසින් දක්වා නැතත් එසේ හැඳින්වීමේ විද්‍යාත්මක පදනම වන්නේ ඔහු විසින් ම දක්වා සිටිනු ලබන උත්තේජකර නාඩි තුන පිළිබඳ විග්‍රහකර ගැනීමෙනි. අපත්‍යපථ බිත්තියේ රැඳී සිටින නාඩි ත්‍රිත්වය ස්ත්‍රී පුරුෂ සංවාසයේදී ආනන්දකර, ප්‍රසංගාත්මක මනෝභාවයන් උපදන උත්තේජන ස්ථාන නිසා බව පැහැදිලිවේ. එමෙන් ම උපදින්නට යන කළලයේ ස්ත්‍රී පුරුෂ ලක්ෂණය, (Raghuram, 2018) උත්තේජනය සඳහා ගත වන කාලය අනුව නිශ්චය වන බව කතුවරයා විසින් දක්වා ඇත.

*යෝනි*යේ හැඩය විග්‍රහ කිරීම සඳහා උපමා රූපක දැක්වීමේදී ආචාර්ය සුශ්‍රැත සහ වාග්භට (Shastri, 2009: Gaud, 1979) විසින් ශංඛනාභි ආකෘති යන පද යුගලය භාවිත කරනු ලැබ ඇත. *යෝනි*යේ ආරම්භක කෙළවර සිහින් අතර මධ්‍ය කොටස මහත් සහ ගර්භාශයට සම්බන්ධිත කෙළවර නැවත පටු වේ. ශංඛනාභියේ මෙන් ආවර්ත තුනක් ඇතුළතෙහි

පිහිටි බවත් විග්‍රහයට අඩංගු කරමින් සාර්ථක උපමාරූපකයක් සුශ්‍රැත සහ වාග්භට විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

මේ අනුව මෙම *යෝනි* පද නිරුක්ත කරණයෙහි, විවිධ ආචාර්යවරු *යෝනි* යන පදය, රූපාකාරයෙන් ද රචනා ශරීර විග්‍රහයේදීද භෞත ශාරීර ක්‍රියා විග්‍රහයේදීද සායනික භාවිත අධ්‍යාපනයේදීද චිකිත්සාවේදීද පශ්චාත් සංවාසිත පුත්‍රී අනාවැකි ඉදිරිපත් කිරීමෙහිද වශයෙන් ඉතා ප්‍රායෝගිකවූ නිරුක්ති භාවිතයක් සිදුකරති. *යෝනි* පදයෙන් ස්වායක්තව සහ *යෝනි* පදයට සමානවාචී අර්ථ ව්‍යුත්පන්නයන්ගෙන් බැහැරව එකී අවයවය සම්බන්ධයෙන් වූ සංස්කෘත පාඨ රචනාවේදී එම නිරුක්ති පද භාවිත වී ඇත. එබැවින් ඊට අදාළ නිරුක්තකරණයද ඉතා සරළවූ ස්වරූපයක් ගනී.

**වගු අංක 05: හග** පද විග්‍රහ සංක්ෂේපය

| ***හග* -female gentles / vulva** | | |
|---|---|---|
| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
| | ඩල්හන | *යෝනි* පරිමාණ විග්‍රහය |
| | ටීකාකාර කවිරාජ ගංගාධර | ස්ත්‍රී ලක්ෂණ හඳුනා ගැනීමට ඇති සලකුණ වශයෙන් |
| | මාධව නිදාන | "භගන්ධර" රෝග විග්‍රහය |
| | වාත්ස්‍යාන කාමසූත්‍ර ශක්ති සම්ප්‍රදාය ශිව සම්ප්‍රදාය | ස්ත්‍රී ලක්ෂණ හෙවත් ස්ත්‍රී ජනන ඉන්ද්‍රිය නම්කිරීම |
| | ආයුර්වේද වාත්ස්‍යායන කාමසූත්‍ර සහ ශිව සම්ප්‍රදායන්ට අයත් ශබ්ද කෝශ | ශාරීර විඥානික අර්ථය (ස්ත්‍රී *යෝනිය*) |
| | "ශක්ති" සම්ප්‍රදායට | ත්‍රිකෝණයේ හැඩය |
| | සතසාහස්‍ර සම්හිතා | හගමුද්‍රා |

අමරකෝශ ශබ්දකෝශයට අනුව *යෝනි* පදය, හග ශබ්දයේ දක්වා ඇත. ටීකාකාර ඩල්හන එම පදය *යෝනි* පරිමාණ විග්‍රහයට යොදා ගැනීම නිසා හග යනු *යෝනි* බව පැහැදිලි වේ (Shinde et al., 2022). එමෙන්ම චරක සංහිතාව අනුව එය අංගුලි 12ක් වශයෙන් ප්‍රමාණ විග්‍රහය කර ඇත.

ටීකාකාර කවිරාජ ගංගාධර ස්ත්‍රී ලක්ෂණ හඳුනා ගැනීමට ඇති සලකුණ වශයෙන් හග යන පදය යොදා ඇත. ප්‍රතිකාරයක් වශයෙන් යොදනු ලබන වෛතරණ වස්තිය රඳන ස්ථානය විග්‍රහයේ දී එය ගර්භාශයට පහළින් රඳා සිටින බව දක්වයි (Gaud, 1979). එම විග්‍රහයට අනුව හග යන පදය ස්ත්‍රී ලිංගය දැක්වීම සඳහා යොදන බව පැහැදිලි වේ. එහෙත් සුශ්‍රැත සංහිතා භගන්දර රෝග විග්‍රහයට අනුව එම රෝගය ආශ්‍රය කරනු ලබන එක් අවයවයක් ලෙස හග ප්‍රදේශය දක්වයි. ඒ අනුවද හග යන පදය සුශ්‍රැත සහ ගංගාධරට අනුව මෙන් ම යොදන අවස්ථාව අනුව අර්ථ විග්‍රහ කර ගත යුතු වේ.

*හග* පදය *යෝනි* පදයට අමතර වශයෙන් මාධව නිදාන කර්තෘ විසින් දක්වා ලැබ ඇත. (Kumarasingha, 2006) හග යන පදය මාධව නිදානයෙහි හමුවන්නේ භගන්දර රෝග විග්‍රහයේදීය. එහි දක්වන්නේ හග ප්‍රදේශයේ ඇතිවන කඩතොලු සහිත වූ මහත් වේදනාකාරී රෝග තත්ත්වය පිළිබඳ කරුණු විග්‍රහයේ දී ය. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙහිම ශ්‍රෝණි ප්‍රදේශයට අයත් අවයවයන් වන හග, ගුද සහ වස්ති අතර පවතින ස්වාභාවික සම්බන්ධතාව බිඳෙන රෝගයක් වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමේ දී හග පදය හමු වේ.

හග යන පදයට ආයුර්වේද ශබ්ද කෝශ ඇසුරින් පද නිරුක්ති දක්වා ඇත්තේ ස්ත්‍රී ලිංග අවයවන් (female gentles / vulva) සම්බන්ධව වුවද, වෙනත් සම්ප්‍රදායන්ට අයත් ශබ්දකෝශ ඇසුරින් විග්‍රහ කරගැනීමේදී, ශාරීර විඥානීය අදහසක් ඉක්මවා විශ්වාස සහ ඇදහිලි සම්බන්ධ විග්‍රහයකින් මතුවන ආධ්‍යාත්මිකත්වයට නැඹුරුවූ ශාස්ත්‍රීය අර්ථකථනයක් හෙළිවේ. වාත්ස්‍යායන කාමසූත්‍ර, ශක්ති සම්ප්‍රදාය (Shaktism; Shaktism a goddess-centric tradition of Hinduism.) සහ ශිව සම්ප්‍රදාය (Shaivism) (Wisdom Library, n.d.) යන ශාස්ත්‍රයන්හි ඍජු ව ම ස්ත්‍රී ලක්ෂණ හෙවත් ස්ත්‍රී ජනන ඉන්ද්‍රිය නම් කිරීම සහ ස්ත්‍රී අවයවයක් ලෙස විස්තර දක්වා ඇත. එහෙත් මෙහිදී හග යන පදයට නිරුක්ත සෙවීමේ දී ශාරීර විඥානික අර්ථයන්ට වඩාත්ම ගැළපෙන අර්ථයක් ඉදිරිපත් කරන්නේ ආයුර්වේද, වාත්ස්‍යායන කාමසූත්‍ර සහ ශිව සම්ප්‍රදායන්ට අයත් ශබ්දකෝශවලින් පමණි. එය ස්ත්‍රී ලක්ෂණය, සළකුණ මෙන් ම ස්ත්‍රී යෝනිය යන අර්ථය මෙම ශබ්ද කෝශ විග්‍රහයන්හි දක්වා ඇත.

මෙහි ශක්ති සම්ප්‍රදායට අනුව හග යනු ත්‍රිකෝණයේ හැඩය බව දක්වයි. (Wisdom Library, n.d.)

(wisdomlib, n.d.) එවැනි හැඩති කන්දක් මුදුනේ වසන දේවතාවියක් සඳහා යක්ෂයන් හා දෙවියන් දිව්‍යමය මාණික්‍ය, කපුරු, කස්තුරි, රක්තපාරද (vermilion) වලින් පුදනලද විග්‍රහයක් විස්තර කර ඇත. එහිදී එම දිව්‍යංගනාව ත්‍රිකෝණයට ආදේශ කර ඇත. ඒ අනුව එම ත්‍රිකෝණයට භග යන නාමයත් එම හැඩය ගර්භාශයට ද, බාහිර ස්ත්‍රී ලක්ෂණයටද ඇති නිසා මෙම භග යන නාමය යෙදේ.

ඒ අනුව භාවනාවේදී පවත්වා ගන්නා පිරමිඩ ආකාර ශරීර මුද්‍රාවද වන්දනීය තත්ත්වයට පත් වේ. ආනාපානසති භාවනාවේ පවත්වන මෙම මුද්‍රාව පොළොව සමග ශරීරය සමතුලිත කරයි. එම මුද්‍රාව භග මුද්‍රා ලෙස හැඳින්වේ. සංස්කෘත ශබ්දකෝශයේ ව්‍යාකරණ විග්‍රහයට අනුව එය පුරුෂ ලිංග (Masculine) නාම පදයක් වේ. එමෙන්ම භග පදය සෞභාග්‍ය, ආදරය, රූපවත් බව සහ ආකර්ෂණය යනාදී බොහෝ වචන අර්ථ සපයා ඇත. මීට අමතරව යෝග දර්ශනය හෙවත් යෝග සම්ප්‍රදායේ ඍජු ව ම එහි ශරීර විඥාන අර්ථයක් සමග ගැළපෙන්නා වූ *යෝනි* මාර්ගය වෙත ආදේශ කර ඇත (Wisdomlib on line, 2023).

මේ වනවිට අධ්‍යයනය කර ඇති කරුණු ඇසුරින් දන්නා පරිදි *යෝනි* මාර්ගය සංඛ නාභි ආකෘති වශයෙන් විග්‍රහ කර ඇත. එම හැඩයද ත්‍රිකෝණාකාර නිසා *යෝනි* පදය සහ භග පදය සමාන අර්ථයේ යෙදීම සාධාරණ වේ. ඒ අනුව භග යනු ත්‍රිකෝණාකාර හැඩතල සඳහා යෙදිය හැකි පදයක් වන අතර එය විශ්වයේ පවතින මූලික සමතුලිත හැඩ අළලා නිෂ්පත්ති වූ පදයක් ලෙස යුක්ති (Logical deduction) සහ උපමාන (analogy) ශබ්ද (word, testimony) ඥානයෙන් විග්‍රහ කර ගත යුතු වේ.

භග පද නිරුක්ති සැපයීම විශ්වයේ මූලික හැඩ ඇසුරින් යෙදී ඇති අතර එම හැඩ මුද්‍රා වශයෙන් ශරීරයේ පවත්වා ගැනීමෙන් ලැබෙන සැනසිලිදායක බව අත්දැකීමක් වශයෙන් සලකා එයට සෞභාග්‍යය, ආදරය, ප්‍රීතිය සහ රතිය වැනි ප්‍රායෝගික අර්ථ නිෂ්පත්තියක් සපයා ඇති බව ඥනනය වේ. එවැනි හැඩතල ස්ත්‍රී ශරීරයේ දකින්නා වූ ඍෂි භාෂිත සාහිත්‍යයෙහි ඍජුවම එම පදය රූපාදර්ශ උපමා රූපක සමානතාවකින් ගෙන ස්ත්‍රී බාහිර භග මස්තකය (pubic region) *යෝනි* මාර්ගය (vagina) ගර්භාශය (uterus) බාහිර වස්ති ප්‍රදේශය (vulva or female perineal region) වශයෙන් ශරීර විඥානාත්මක පද යෙදෙන ස්ත්‍රී අවයවයන්ට සමාන කර ඇත.

**වගු අංක 06: ගර්භ මුඛ** පද විග්‍රහ සංක්ෂේප

| නිරුක්ති | නිරුක්ති විග්‍රහ ග්‍රන්ථගත ස්ථානය | නිරුක්තකරණ සංක්ෂේපය |
|---|---|---|
| ***ගර්භ මුඛ*** | | |
| *ගර්භ මුඛ* | වාග්භට අෂ්ටාංග සංග්‍රහ උත්තර ස්ථාන ඉන්දු ටීකා 37 | ගර්භ විවරය (Internal os - cervix) |
| බාහ්‍ය ස්‍රෝතස් විග්‍රහය | සුශ්‍රැත සංහිතා ශාරීර 5 | *යෝනි මුඛ* අන්වර්ථ වීම |
| ***අපරා මුඛ*** | කාශ්‍යප සංහිතා ශාරීර 5 පී. වී. තිවාරි | ප්‍රසූත ආසන්න වීමේදී හට ගන්නා ගර්භ ශූලයත් සමග "*අපරා මුඛ*" විස්තාරණය වීම |

ගර්භ විවරය (Internal os - cervix) හඳුන්වා දීම සඳහා ගර්භාශ ද්වාර මුඛ සහ ගර්භ මුඛ ඇතුළු සමාන පද යෙදීම් හතක් (07)ක් මෙම අධ්‍යයනයේදී හමුවේ (Lakshmi et al, 2019; Singh et. al, 2016).

ඒවාට නිරුක්ත වශයෙන් කරුණු අධ්‍යයනයේදී චරක විමාන ස්ථානය 5 වන අධ්‍යාය ආයුර්වේද ශරීර රචනා විග්‍රහයෙහි එන ස්‍රෝතස් හෙවත් ශරීරගත වාහිනී පද්ධතියේ විග්‍රහයට අදාළ ව ස්‍රෝතස් පදයට සමාන වාචී ශබ්ද වශයෙන් යෙදෙන පථ සහ මාර්ග යන පද සමාකරණය ඔස්සේ මෙම පද නිරුක්තකරණය වේ. මෙම මුඛ හෙවත් විවර සහ මාර්ග යනු යමක් වහනය වීමට ඉඩ සලසන අවකාශ වේ (Sharma & Dash, 2003).

- ඒ අනුව *යෝනි* මුඛ පදය සුශ්‍රැත ශරීර තුන්වන අධ්‍යායේ 10 වන ශ්ලෝක පාඨය ආචාර්ය සුශ්‍රැත විග්‍රහ කර ඇත්තේ, (Murthy, 2004) ආර්ථව රුධිරයේ භෞත ක්‍රියාව විග්‍රහ කරමින් මසක් තුළ ආර්ථවවහ ධමනීන්ගේ රැස්වුණු රුධිරය වායු ආධාර කොට ගෙන *යෝනි* මුඛ යෙන් බැහැර වන බව සඳහන් කිරීමෙනි. විග්‍රහයට අනුව බාහිර *යෝනි* මුඛය සහ අභ්‍යන්තර *යෝනි* මුඛය යන ස්ථාන දෙකෙහිම මෙම පදය අර්ථ ගැන්වෙන බව නිරීක්ෂණය වේ.

- තවදුරටත්, අෂ්ඨාංග සංග්‍රහ (Aathvale, 1980) ටීකාකාර ආචාර්ය ඉන්දු *ගර්භාශ ද්වාර මුඛ* පිළිබඳ *කර්ණිනි යෝනි* ව්‍යාපත් විග්‍රහයේදී දක්වා ඇත. (Bala et al., 2020)මේ අනුව, මෙහිදී අදහස්

වන්නේ *යෝනි මුඛ* යනු *ගර්භ මුඛ* බව වාග්භට ගේ පද යෙදීම නැවත සනාථ කරයි.

- සුශ්‍රැත සංහිතා ශාරීර පස්වන අධ්‍යායේ 39 පාඨයේ (Murthy, 2004) ඉදිරිපත් කරන ස්ත්‍රීන්ගේ අමතර පේශි විග්‍රහයේදී පේශි තුනක් ගර්භ ඡිද්‍ර වටා පිහිටන බව දක්වයි.
- ශාරංගධර පූර්වඛණ්ඩ පස්වන අද්‍යායේ 44 පාඨයේ රන්ද්‍ර යන පදය ස්ත්‍රීන්ට පවතින අමතර විවර දක්වීමේ දී ගර්භ වර්ත්ම සහ ගර්භ රන්ද්‍ර පද ගර්භ මුඛය සඳහා යොදා ඇත (Bala et al., 2020; Gunadasa, 1964).
- වාග්භට අෂ්ටාංගසංග්‍රහ උත්තර ස්ථාන ඉන්දු ටීකා 37 හි 14 වන ශ්ලෝක පාඨය විග්‍රහ කරමින් ගර්භ මුඛ පදය, ගර්භ විවරය (Internal os - cervix) සඳහා යොදා ඇත.
- සුශ්‍රැත සංහිතා ශාරීර පස්වන අදධ්‍යායේ 10 වන ශ්ලෝක පාඨයේ බාහ්‍ය ස්‍රෝතස් විග්‍රහයේදී එක් රක්තවහ ස්‍රෝතසක් ගැන දක්වමින් විස්තර කරන්නේ *යෝනි* මුඛ බව අදහස් කළ හැකි ය (Trikamji, 2005).
- ප්‍රසූත ආසන්න වීමේදී හට ගන්නා *ගර්භ ශූලයත්* සමග "*අපරා මුඛ*" විස්තාරණය වීම පිළිබඳව කාශ්‍යප සංහිතා ශාරීර පස්වෙනි අධ්‍යායයේ තුන්වන ශ්ලෝක පාඨය (Tivari, 1996) විග්‍රහ කරයි.

***කලල* ;** යන පදය හාරිත සංහිතා කර්තෘ සංසේචිත බීජය වර්ධනය වන අවධින් දක්වීමේ දී ගර්භ පදය නොයොදා *කලල* යන පදය යොදා ඇත. එමගින් වර්ධනයේ මූලික ම අවස්ථාවේ ස්වරූපය අවබෝධවීම සඳහා යොදා ඇති බව පැහැදිලි වේ. අනතුරුව එළඹෙන වායුවේ ක්‍රියාව මගින් ඇතිකරන බුද්බුධාකාර අවස්ථා පසුකර නැවත එම *කලල* ය පංච භූත අග්නි ක්‍රියා මගින් ඝනැති පිණ්ඩයක් බවට පත්වන බවත් දක්වයි. ඒ අනුව *කලල* පදය යෙදෙන්නේ වැඩෙන ගර්භයේ මුල් සති අටක කාලය දක්වීමටයි.

*කලල* පදය පී.වී. තිවාරි, වෘද්ජීවක තන්ත්‍රය උපුටා ගනිමින් පැහැදිලි කරන්නේ අවිවාහක තරුණියක විසින් ආර්ථව වහන සමයේ අනුගමනය කරනු ලබන (තන්ත්‍රගත) මිථ්‍යා විහරණ නිසා හටගන්නා *කලලය* පීතෘ සම්භව ශරීර ඌනතාවන් ගෙන් යුතු එනම් අස්ථි, කේශ, නිය රහිත ඝන මස්වැදැල්ලක් (කලළයක්) ලෙස ගර්භ ලක්ෂණ අනුපිළිවෙළින් දක්වා නිසි කල පූර්ණ වී ප්‍රසූත කරන බව යි. *කලල* යන අර්ථය භාෂාවේ යෙදෙන්නේ මඩ හෙවත් කලල් දිය (මඩ වතුර) පිළිබඳ සඳහන් කිරීමේදී ය. ඒ අනුව තරුණියක් ගර්භ වර්ධන සංඥා අනුපිළිවෙලින් පහළ වෙමින් නියමිත කාලයේ ප්‍රසූත කරන්නේ අස්ථිවලින් විහීන වූ දෘඪ බව රහිත කලලයක් හෙවත් මස් වැදැල්ලක් බව විග්‍රහ වේ (Tiwari, 1996, pp. 163, 185).

මේ අනුව අවසාන විග්‍රහය වන්නේ වැඩෙන ගර්භය පොදුවේ *කලලය* නමින් ද හඳුන්වන බවත් *කලල* වෙනත් ව්‍යවහාරයන්හි ද යෙදෙන වචනයක් බවත් ය. *කලල*යේ පවතින මෘදු බව සහ අස්ථාවර බව පැහැදිලි කිරීම නිරුක්ත වශයෙන් දැක්විය හැකි වෙයි. මෘදු බව සහ වැගිරෙන බව ස්වභාවික ව දැකිය හැක්කේ මඩදියෙහි හා මඩ සහිත පසෙහි වන අතර එහි ඇති පිලී ගඳ *කලල* යන අර්ථය නිරුක්ත කිරීමේ දී සලකා ගත යුතුයි. එම ස්වරූපය ම වැඩෙන ගර්භයේ මුල් සතියේ දැකිය හැකි බැවින් අසම්පූර්ණිත කාලයකින් දරු ප්‍රසූතිය සිදුවීමේ දී මෙම මඩ හෙවත් *කලල* ස්වරූපය හඳුනාගත හැකිය. මෙම විමර්ශනය ප්‍රායෝගික අත්දැකීමෙන් සහ භෞතික ලෝකයේ පවතින සදෘශ වස්තූන්ගේ උපමා කර පදය නිරුක්ත වී ඇත. ඒ අනුව වැඩෙන ගර්භයේ මුල් කාල පරිච්චේදය (මුල් මාස දෙක) *කලල* යන නමින් ද මුල් මාසයේ සිදුවන ප්‍රසූතිය *කලල* ප්‍රසූතියක් බවත් එමෙන්ම තවදුරටත් කාශ්‍යප විග්‍රහයට අනුව පුරුෂ භාව රහිතව පූර්ණ මාසිකව ප්‍රසූත ගර්භයද කලලය ලෙසත් හැඳින්වේ. මෙම අධ්‍යයනයේදී *කලල* පදය සම්බන්ධව දෙආකාරයක *කලල* ප්‍රසූතියක් පිළිබඳ නව හැදෑරීමක් වන මේ විග්‍රහය ඇසුරින් උපමා සහ ශබ්ද ගොඩ නැගේ.[4]

*කලල* යන පදය පාලි, බෞද්ධ හා සංස්කෘත වාක් කෝශවල ගර්භය, මෘදු පස (හෙවත් මඩ පස), හා වැදෑමහ එමෙන්ම ගර්භයේ පළමු සතිය දක්වීම සඳහාත් නාමිකව ඉදිරිපත් කර ඇත. තවද ගර්භාශයේ කලලය මෙන්ම ස්ත්‍රී අවයවය සමග සම නොවන අර්ථ සැපයෙන්නා වූ, සමින් කළ මල්ල (leather bag) සහ අස්ථි (bones) වැනි වෙනත් දෑ සඳහා ද යෙදී ඇත. එහෙත් ඒවායේ ගැඹුරු අර්ථ විග්‍රහයක් ශබ්ද කෝශයන්හි ඉදිරිපත් කර නැත.

***ජරායු;*** යනු වැඩන ගර්භය ආවාරණය කරන ස්ථරයයි (Amniotic Membrane). එය ගර්භය සමග දෙවනුව බැහැර වේ. එය වැඩෙන ගර්භයේ

[4] කාශ්‍යප සංහිතාවේ 163 පිටුවේ සඳහන් වන ජාතහරිනි අන්ඩග්නී ප්‍රභේදයද (වාත දෝෂය ආදිය ආවේගය ලබන විට), හෝ ගර්භිනී මවගේ අනාචාර හේතු නිසා ගර්භ ස්ථාපනය බිඳවැටෙන්නාවූ හෙවත් (blastocystic stage abortion) 185 වන පිටුවේ සඳහන් වන ජාතහරිනි දුර්ධරා ප්‍රභේදයද (ශරීර කොටස් ඌනව වර්ධනය වීමෙන් ) මේ ආකාරයේම කලල ප්‍රසූතීන් වේ. (Sharma, H. (Ed.). (1996)

කොටසක් මෙන් වර්ධනය වෙමින් බාහිර පරිසරයේ පීඩනාඝාතවලින් ආරක්ෂා වනවා මෙන් ම එය පෝෂණ තටාකයක් (nutritional pool) ලෙසත් ක්‍රියාත්මක වේ (Tivari, 1996). මෙය සිංහල ව්‍යවහාරයේදී මස් වැදල්ලක දෘශ්‍ය උපමා ස්වරූපයට අනුගත කරමින් එදිනෙදා භාවිතයට ගැනී ඇත. ඒ අනුව වැදෑමස යන පදය තව දුරටත් උච්චාරණ පහසුව සඳහා "වැදෑමහ" ලෙස වහරනය වේ. (ස්ත්‍රිය විසින් ප්‍රසූතියේ දී (ද්වීතීයිකව) වදන මස - වැදෑමස)

*ජරායු* පදයේ ද්වීතීයික විග්‍රහයක් ද ඉදිරිපත් කළ හැකිවේ. ජරා පද අර්ථ ගැන්වීමේ දී දිරායන, ක්ෂය වන සහ ප්‍රකෘති ස්වරූපයෙන් වෙනස් වෙමින් භාවිත නොකළ හැකි විකෘති වන්නා වූ හෙවත් වෙනස් ස්වරූපයකට පත් වන යනා දී වශයෙන් ජරා පද අර්ථ ගැන්වේ. වචනය සම්පූර්ණ වන්නේ "යු" ප්‍රත්‍ය ය යෙදීමෙනි. ජීවත් වීමට නියමිත දරුගැබ ප්‍රසූතියෙන් පසු ප්‍රසූත වන්නාවූත්, එහි වහා ආයුෂ කෙළවර වන්නාවූත් සහ ඉක්මනින් විනාශ වීම නියමිතවූත් අර්ථයෙන් මෙම *ජරායු* පදය යෙදී ඇති බව පැහැදිලි වේ. මේ අනුව ක්ෂයවීමෙන් යුතු යනු *ජරායු* වශයෙන් නිරුක්ත සැපයීම කළ හැකිවේ.

*ජරායු* පද විග්‍රහය තවදුරටත් විසඳීමේදී පිටුව 186 පී. වී. තිවාරි කාශ්‍යප සංහිතාව උද්ධෘත කර ගනිමින් වැඩෙන දරුවාගේ මුඛය "*ජරායු*"වෙන් (Amniotic Membrane)වැසී ඇති බව දක්වමින් ග්‍රීව අභ්‍යන්තරය හෙවත් බන්ටය (Throat) කළු දෝෂයෙන් අවහිර කර ඇති බවත් එනිසා වැඩෙන ගර්භය හැඬීමක් නොකරන බවත් දක්වා ඇත.

වාග්භට අෂ්ටාංග සංග්‍රහ පස්වන හෙවත් අංගවිභංග ශරීර අධ්‍යායේ 19 පාඨයේ (Murthi, 1996) *ජරායු* පදය chorionic membrane ලෙස පරිවර්තනය කරමින් එම ශරීර ව්‍යුහය ඉතා අල්ප රස ධාතු ප්‍රමාණයකින් සහ සප්ත ධාතුවේ රස සාරයෙන් (essence) සෑදී ඇති බව දක්වා ඇත.

සුශ්‍රැත සංහිතාවේ පසුකාලීන ටීකාකරුවකු වන ඩල්හන තවදුරටත් විග්‍රහ කරමින් *ජරායු* මගින් බාහිර පරිසරයේ සෝෂාකාරි වායුව ඇතුළු වීම අවරෝධ කරන බව දක්වයි. මේ පිළිබඳ ව විග්‍රහ කිරීමේ දී කලල් දිය (Amniotic fluid) තුළ වැඩෙන කලලයේ ආරක්ෂණ යාන්ත්‍රණය එහි තරලය සහ පීඩන අවශෝෂක වැදෑමස හෙවත් *ජරායු*ව මගින් සිදුවන බව අවබෝධ වන හෙයින් *ජරායු*ව යනු ආරක්ෂාව සහ පෝෂණය සපයන උල්පතක් බැවින් එය හෘදය වස්තුවේ ක්‍රියාව ඉක්මවා යයි.

***අපරා;*** *අපරා*වෙහි හටගැනීම කාශ්‍යප විග්‍රහය පී.වී. තිවාරි, පිටුව 146 විග්‍රහයට අනුව "*අපරා*"ව හෘදය වස්තුවට සමානකරණය කරයි. *අපරා*ව මූලික වශයෙන් අපිරිසිදු රුධිරය පිරිසිදු කර " විශ්ණුපදාමෘතය" (oxygen) පමණක් පෙරා දෙන උපකරණයකි. මිනිස් හෘදය මෙන් ක්‍රමාංකිත පීඩන අනුපාතයකට අනුව හැසිරෙන ධමනියකින්, වර්ධනය වෙමින් පවතින ගර්භයට මුදාහරී. මේ අනුව මෙහි මවට සමීප කෙළවර හෘදය ක්‍රියාව ඉටුකරන අතර *අපරා*ව ක්‍රියා ව්‍යුහයට අනුව ගර්භය පසින් මවට එන අපිරිසිදු රුධිරය පෙරා හරී. ඒ අනුව *අපරා*ව මවගේ පසින් එළඹී දෙවන හෘදයක් වශයෙන් ක්‍රියාත්මකව, වැඩෙන ගර්භය ජීවත් කරවයි. මේ අනුව *අපරා*ව යනු දුරින් පිහිටි මවගේ හෘදය වන අතර මෙය මාතෘ පදවියට පත්වන ස්ත්‍රියකට උරුමවන අවයවයකි.

තවදුරටත් මේ කරුණ සංසන්දනාත්මක ව විග්‍රහ කරන්නේ නම් ගර්භනී ස්ත්‍රීන් විෂයෙහි ඇති දෞහෘද විග්‍රහයද මේ යටතට අඩංගු කරමින් *අපරා*වේ මෙහිදී කළ විග්‍රහයට අනුව ගර්භනී ස්ත්‍රියකට හැඟීම් (චේතනා) සංසරණය වන හෘද දෙකක්ද සහිත ඉහත කී විග්‍රහයට අනුව භෞතක්‍රියාවෙන් යුතු හෘදය තුනක් පවතී. (මෙය ආයුර්වේද අධ්‍යයනයේදී හමුවන බ්‍රහ්මහෘදය අත්හැර කළයුතු ගණනය කිරීමකි) .

***උල්බ* (උල්ව);** *උල්බ* පදය මෑතකාලීන පර්යේෂකයන් සිය ලිපිවල (Gurmule & Lanjewar, 2018) ගර්භාශ පදය සමග පද විග්‍රහයේ දී ඉදිරිපත්කර ඇතත් එය රචනා ශාරීර යටතේ නොව කලලවිද්‍යාත්මක අර්ථ කථනයට පමණක් තේමා වූවකි.

මෙම පදය සුශ්‍රැත චිකිත්සා 37 අදධ්‍යායේ පිටුව 616-632 ගර්භය හැදින්වීමේ දී යොදන්නේ එහි වැඩෙන ගර්භය ක්‍රියාකාරිත්වයට නිපදවෙන ද්‍රව කොටස් පිළිබඳ මෙන්ම ගර්භය මත ඝනීභවනය වන මේද තත්ත්ව ඉවත්කිරීමේදී ප්‍රසූතියෙන් පසු වහාම කළ යුතු වැඩපිළිවෙළ විග්‍රහ කිරීමේදී ය (Sharma, 2000). ඒ අනුව *උල්බ* යනු ගර්භාශයට අයත් අවයවයක් නොව වැඩෙන ගර්භයේ ද්වීතීයික ව හටගන්නා තරලයකි. *උල්බ* වචනය මේ අනුව ගර්භාශයේ ශරීර රචනාත්මක සමානතාවයක් නොදක්වයි. එහෙත් විෂයට අදාළ ව ලේඛන පරිහරණය කරන්නන්ගේ දැනුම සඳහා මෙම විස්තරය අදාළ අධ්‍යයනයේදී හමුවූ කරුණක් වශයෙන් මෙහිදී ඉදිරිපත් කෙරේ.

*උල්බ* යනු *උල්බ* තරලය යනු හෙවත් ගර්භ තරලය (Amniotic fluid) වැඩෙන ගර්භය මත ඝන වීම නිසා හට ගන්නා වෙඩරු වැනි පදාර්ථයකි. සුශ්‍රැත නවජාත ශිෂු පරිචර්යා විග්‍රහයේදී දරුවාගේ මුඛය සහ හිස්මුදුන (බ්‍රහ්ම-රන්ද්‍රය) පිරිසිදු කිරීමේදී එය ඉතා ආරක්ෂාකාරී ව සහ අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු බව මෙන් ම ඒ සඳහා යොදා ගත යුතු ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ විග්‍රහ කිරීමේදී මෙම *උල්බ* යන පදය යොදා ගෙන ඇත. ඒ මගින් *උල්බ* ඉවත් කිරීමේ ක්‍රියාවලියේ විස්තරාත්මක පැහැදිලි කිරීමක් දක්වා ඇත.

(Sharma, 2000) එහි තව දුරටත් උල්බක රෝගය පිළිබඳ ව විග්‍රහ කරමින් නව ජාතයාට පෙවී ඇති *උල්බ* තරලය නිසි පරිදි වමනය නොවීමේ දෝෂ දැක්වීමේදී ද විග්‍රහ කර ඇත.

## 4. නිගමන සහ නිර්දේශ

ගර්භ පදයට මෙන් නිරුක්ති සහ නිරුක්තකරණයක් ගර්භ පදය සඳහා යෙදුනු සෙසු පදවල හමු නොවේ' විශේෂයෙන් —අන්තර්ගත එලම්, ගර්භ ආධාර, *ගර්භ කෝෂ්ඨ*, *එල* සහ *එලයෝනි*, *කුක්ෂි*, *ධාරා*, ගර්භසයියා යන පදවල හමුවන්නේ ඍජු කෝශගත අර්ථ නොමැති වූ සමානවාචී පද යෙදුමක් පමණි. ආධාර, *ධාරා*, සයියා, එල යනාදි  වශයෙන් ගර්භ සමග යෙදෙන දෙවන පදයට සම්බන්ධ කර මෙම සමානවාචී අර්ථ ඇති පද නිර්මාණය කර ඇත. එසේ වුවද *ක්ෂේත්‍ර* පදය තනි පදයක් වශයෙන් නිරුක්ති සහ පුළුල් නිරුක්ත විග්‍රහයන්ගෙන් යුක්තව චරක සුශ්‍රැත ප්‍රමුඛ ආයුර්වේද ග්‍රන්ථවල ශාරීර රචනා සහ ක්‍රියා මෙන් ම රෝග විනිශ්චයෙහි සහ ප්‍රතිකාර නිර්දේශයෙහි සංස්කෘත පාඨ තුළ අන්තර්ගත ව ඇත.

*යෝනි* පද නිරුක්ති සැපයීම ව්‍යුවහ සමාන වාචී නොවීමත් ප්‍රායෝගික භාවිතවූ සහ යථාර්ථවාදීවූ සරල සුගම නිරුක්තකරණයකට ඉඩ ලැබීමත් *යෝනි* පදය නිරුක්තිකරණයෙහි සුවිශේෂීවූ හඳුනාගැනීමක් වේ. යෝනි විග්‍රහය රූපක දක්වීමෙන් අවයවය පිළිබඳ චින්තාමය රූපක ප්‍රජානනය ඔස්සේද රචනා ශරීරාත්මක වූ ද භෞත ශාරීරික වූ ද චිකිත්සා උපයෝගී වූ ද සායනික අභ්‍යාසාත්මක වූ ද මෙන් ම පශ්චාත් සංවාසිත පුත්‍රී අනාවැකි ඉදිරිපත් කිරීමෙහි ද යෝනි පද නිරුක්තකරණය සිදු කළ හැකිවන සේ සංස්කෘත ගද්‍ය සහ පද්‍ය රචනාවේදී භාවිතවීමෙන් සහ යෙදීමෙන් විද්‍යාර්ථියා උගතකු මෙන් ම චිකිත්සා කුසලතා හි උසස් ප්‍රජානනයක් ඇත්තෙකු කරයි.

වස්තුවක සමතුලිතතාව ය සම්බන්ධ විශ්වීය රූපාකාරයක් වූ ත්‍රිකෝණ හැඩය එම රූපානුගත වූ දේවත්වය එනිසා හටගන්නා වූ මනෝභාව ඇසුරින් ගොඩ නැගෙන්නා වූ කතුවරවිඥානය මෙම වේදභාෂිත වූ භග පදය නිරුක්තිකරණයේදී මූල බීජය වී ඇත. ශරීර රචනාත්මක නාමකරණයක් නිවැරදිව දැක්වීම සඳහා යෝග දර්ශන යෙහි සහ ආයුර්වේද මූලග්‍රන්ථවල ත්‍රිකෝණ හැඩතල උපයෝගීත්වයෙන් භග මස්තකය, *යෝනි* මාර්ගය, ගර්භාශය සහ බාහිර වස්ති ප්‍රදේශය නාමකරණය කර ඇත.

ගර්භ විවරය (Internal os - cervix) බොහෝ සෙයින් ස්‍රෝතසක කාර්යක් ඉටුකරන බැවින් එහි හටගන්නා රෝග සහ රචනා ව්‍යුහය සාකච්ඡාවේ දී ද ප්‍රසූතියේදී සහ ආර්තව බැහැරවීමෙදීද එමෙන් ම එහි ක්‍රියාකාරිත්වයට අදාළව නාමකරණයෙහි දී ද තවදුරටත් ස්ත්‍රීන් විෂයෙහි ඇති අමතර ස්‍රෝතසක් වශයෙන්ද කරුණු ඒකරාශී වී දැනුම එක්රැස් වීමක් මෙම සුවිශේශිත ගවේෂණයෙන් සිදුකර ඇත.

මෑතකාලීන පර්යේෂණ අධ්‍යයනයේ දී හමුවන ස්ත්‍රීප්‍රජනක පද්ධතියට අදාළ නිරුක්ති සම්පාදනය කිරීමේදී ශරීර රචනාත්මක පද පමණක් නොව කලල විද්‍යාත්මක පදයන්ද අදාළ කරගෙන ඇත. ඒ අනුව කලල, *ජරායු*, *අපරා*, *උල්බ* යනුවෙන් මෙම අධ්‍යනයේදී හමුවන පද චතුෂ්කය ගර්භාශයට සම්බන්ධ ඍජු නිරුක්ත සැපයීමක් නොවන අතර බොහෝ කෝශාර්ථයන් ගෙන් විග්‍රහ වන එම පද ගර්භය සමග වැඩෙන කලලයට පමණක් අදාළ වේ.

එබැවින් ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය සඳහා නිරුක්ති දැක්වීමෙහි මූලික පදනම වී ඇත්තේ ප්‍රජනනාත්මක වශයෙන් හා චිකිත්සාත්මක අංශයෙන් අවධාරණය සිදු කළයුතු ස්ත්‍රීප්‍රජනක පද්ධතියේ අංග සඳහා පමණි.

නිරුක්ති වශයෙන් මෙම අධ්‍යයනයේදී විග්‍රහිත පදවල හමුවන ඉතා දීර්ඝ නිරුක්තකරණය ඔස්සේ තවදුරටත් නිගමනය කළ හැක්කේ ආයුර්වේද සංහිතාගත ගද්‍ය පද්‍ය රචනායෙහිදී නිරුක්ති සියල්ල ම පාහේ කේතාන්විත ව භාවිත කර ඇති බව ය. මෙම හේතුව නිසාම ආයුර්වේද සෑම මූලග්‍රන්ථයකටම ටීකා ග්‍රන්ථ රචනාවීමත් සංස්කෘත භාෂාවෙන් මෙන් ම බොහෝ ආසියාතික භාෂාවන් ගෙන් සහ බටහිර භාෂාවන්ට පරිවර්තනයත් වී ඇත.

එමෙන් ම ආයුර්වේද විෂයේ ගැඹුරු සහ පුළුල් ශාස්ත්‍රීය කරුණු අදාළ විග්‍රහ ස්ථානයන්හිදී නිරුක්තකරණය සිදුකර ගැනීමෙන් සෞන්දර්යාත්මක වූත් සොබාපරිසරාත්මක වූත් ආධ්‍යාත්මික වූත් චේතනා ධාරාවන් විද්‍යාර්ථීන් තුළ ජනිත කරවමින් සමබර අධිප්‍රජානණ විග්‍රහ :ැචසිඑැපසජ ජදටබසඑසදබ* කුසලතාවකින් යුතු චිකිත්සා පෞරුෂයක් ස්ථාපනය කරන බවය.

**කෘතඥතාව-**උපදේශනයෙන්, සෝදු පත් බැලීමෙන් සහ පිටුසැකසුමෙන් සහාය වූ සැමට

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

Aathvale, A. D. (1980). *Srimad Vrddhavagbhata, Astanga Samgraha* (Vol. I). Srimada Atreya Prakashan Nandnandana, Pune.

Acharya, S. R. (2005). *Atharvaveda Samhita*, Vol. 1 (Reprint ed.). Yug Nirmana Yojana, Gayatri Tapobhumi.

Advaita Vedanta. (2008). *Bhagavad Gita Commentary - Chapter*

*13*. http://www.advaita-vedanta.co.uk/index.php/content/81-bhagavad-gita-commentary-chapter-13

Bala, S., Sharma, K., & Prakash, H. (2020). Concept of Garbhashya (Uterus) Garbhashya Dwara Mukha (Cervix) from various Ayurvedic samhitas. *World Journal of Pharmaceutical Research, 9*(8), 207-216: 10.20959/wjpr20208-17731

Bhattacharya, J. (2015). Two anatomies and two systems of medical knowledge: Dissection with or without knife and anatomist. In K. K. Nail & E. S. N. Reddy (Eds.), *Cultural Contours of History and Archaeology* (Vol. 8, pp. 263-280). BR Publishing Corporation.

Bhagavad Gita. (n.d.). In Wisdom Library. Retrieved December 18, 2023, from https://www.wisdomlib.org/definition/kshetra#sanskrit

Britannica. (n.d.). Dualism (religion). In *Encyclopedia Britannica*. Retrieved January 15, 2024, from https://www.britannica.com/topic/dualism-religion

Gaud, D. (1979). *Parishadya Shabdarth Shariraram*. Shri Baidyanatah Ayurved Bhavan Ltd

Gunadasa, S. (1964). *Śārṅgadhara Saṃhitā sahita Siṃhalānuvāda* [Śārṅgadhara Saṃhitā with Sinhala Translation]. M. D. Gunasena and Company, Colombo.

Gurmule, R. K., & Lanjewar, S. R. (2018). Literary review of stri sharira from various Ayurvedic samhitas. *International Ayurvedic Medical Journal*, *6*(8), 1721–1726. http://www.iamj.in/posts/images/upload/1721_1726.pdf

Gulati, N., Gautam, P. P., Suman, S., Kumari, R., & Singh, N. (2020). A critical study of Artavavaha Srotas W.S.R. to its Viddha Lakshana. *World Journal of Pharmaceutical Research*, *9*(3), 397–405. https://www.wisdomlib.org/science/journal/world-journal-of-pharmaceutical-research/d/doc1378873.html

Sharma, H. (Ed.). (1996). *Kāśyapa Saṃhitā or Vṛddhajīvakīya Tantra*, Kalpa Sthāna, Chapter 6, Verses 36–37 (pp. 290). Chaukhamba Sanskrit Sansthan.

Kālidāsa.(n.d.). *Kumārasambhava* (Canto 6, verse 77). In *Wisdom Library*. https://www.wisdomlib.org/definition/kshetra#sanskrit

Kaushik, K., Nandal, U., Sangwan, A., & Kumar, A. (2021). Ancient and contemporary understanding of anatomical and physiological aspect of female reproductive organs. *European Journal of Pharmaceutical and Medical Research*, *8*(10), 437–444. https://www.ejpmr.com/home/abstract_id/6932

Kumar, H., & Kaur, H. (2020). Garbha Sharir: A critical review. *World Journal of Pharmaceutical and Life Sciences*, *9*(12), 25–35. https://www.wjpls.org/download/article/18082017/1504178100.pdf

Kumarasinha A (2006). *Kumarakeli Vyākyā Sahita Mādhava Nidānam Uttarārdha Āyurvēda Grantha* [The *Kumarakeli* Commentary with Mādhava Nidānam Uttarārdha Ayurveda Text]. T. S. Printers.

Lakshmi, K. S., Reddy, N., & Murthy, Y. S. (2019). Anatomical, physiological, and pathological concept of srotas sharir. *Journal of Pharmacognosy and*

*Phytochemistry*, *8*(3), 3687–3690. https://www.phytojournal.com/archives/2019/vol8issue3/PartBB/8-3-538-652.pdf

Mujawar, M., Ahir, J., & Indulkar, S. (2022). Masanumsik Garbhavruddhi: Ayurvedic perspective. *International Journal of Multidisciplinary Health Sciences*, *8*(2), 117–124. https://jaims.in/jaims/article/view/1396

Murthy, K. R. S. (Trans.). (2005). *Suśruta Saṃhitā* (2nd ed., Vol. 1, Śārīrasthāna). Chaukhambha Krishnadas Academy.

Nahar, M., & Jawale, V. (2022). A literary study on Sutika Udarvrudhi according to Ayurvedic classics: A review. *World Journal of Pharmaceutical and Medical Research*, *8*(11), 118–122. https://www.wjpmr.com

National Institute of Indian Medical Heritage. (n.d.). *Sushruta Samhita: Phalama Khanda*. National Institute of Indian Medical Heritage. https://niimh.nic.in/ebooks/esushruta/?mod=read&h=phalama

Panja, A. (n.d.). *The science of Nirukti (Etymology): A tool for exploring clinical knowledge*. *Ayurvedah*. https://www.ayurvedah.in/Articles/Research_Articles/10_nirukti.pdf

Puthiyedath, R. (2019, July 1). Spiritual dimension of fertility, pregnancy and childbirth in Ayurveda essay, prenatal education. *Aurobharati Journal*. https://journal.aurobharati.in/spiritual-dimension-of-fertility-pregnancy-and-childbirth-in-ayurveda-2/

Raghuram, Y. S. (2018, November 29). Anatomy of female reproductive system - Ayurvedic perspective. *Easy Ayurveda*. https://www.easyayurveda.com/2018/11/29/female-reproductive-system/

Shastri, K. A. (2010). *Maharasi Sushruta, Sushruta Samhita* (Vol. 5). Chaukhamba Surbharti Sansthan.

Sharma, P. V. (2000). *Sushruta Samhita* (Vols. 1–2). Choukhamba Visvabharti.

Sharma, R. K., & Dash, V. B. (2003). Caraka Saṃhitā (Vols. I-III). Choukhamba Visvabharti.

Shinde, R. S., & Pande, P. P. (2022). A study on Artavavaha Srotas and its Mulsthana. *International Journal of Trend in Scientific Research and Development (IJTSRD)*, *6*(4), 1102–1105. https://www.ijtsrd.com/papers/ijtsrd50236.pdf

Singh, S., Upadhyay, A., Narayana, A., & Singh, R. H. (2016). Concept of Artavavaha Srotas review article. *Journal of Ayurveda and Integrated Medical Sciences*, *1*(2), 81–86. https://www.jaims.in/index.php/jaims/article/download/32/33

Srikantha Murthy, K. R. (Trans.). (2005). *Aṣṭāṅgahṛdaya* (2nd ed., Vol. 1, Śārīrasthāna). Chaukhambha Krishnadas Academy.

Tewari, P. V. (Ed.). (1996). *Kasyapa Samhita or Vṛddhajīvakīya Tantra*: Text with English Translation and Commentary. Chaukhamba Vishvabharti.

Vagbhata. (1996). *Aṣṭāṅgahṛdaya* (with the commentaries *Sarvanga Sundara* by Arunadatta & *Āyurveda Rasayana* by Hemadri). H. S. Shastri (Ed.). Chaukhamba Surabharati Prakashana.

Verma, V., Singh, S. K., & Chauhan, M. (2014). Review on concept

of srotas. *International Journal of Research in Ayurveda and Pharmacy*, *5*(6), 746-752.

Wisdom Library. (n.d.). *Garbha, Koshtha, Kukshi, Kshetra, Shayya*. Retrieved December 2023, from https://www.wisdomlib.org/definition/garbha#nirukta

Wikipedia contributors. (n.d.). Dharā. In *Wikipedia*. Retrieved January 23, 2024, from https://en.wikipedia.org/wiki/Dharā

Yaska. (ca. 7th–5th c. BCE). *Nirukta*. In L. Sarup (Ed. & Trans.), *The Nighantu and The Nirukta of Sri Yaskacarya: The Oldest Indian Treatise on Etymology, Philology and Semantics* (Reprint ed.). Motilal Banarsidass.